# සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමිකරුවන් සඳහා ණය සහන ලබාදීමේ වැඩසටහනේ කාර්යසාධනය




වාර්තා අංකය - පීර්ආර්/ඒ/2019/එස්එම්ර්/10

## ජාතික විගණන කාර්යාලය

# පටුන

පිටු අංකය


| | | | |
|---|---|---|---|
| 1. | | විධායක සාරාංශය | 1 |
| 2. | | හැඳින්වීම | 4 |
| | 2.1 | පසුබිම | 4 |
| | 2.2 | විගණනය සඳහා අධිකාර බලය | 7 |
| | 2.3 | විගණනය සඳහා මාතෘකාව තෝරා ගැනීමට හේතු | 7 |
| | 2.4 | විගණන ක්‍රමවේදය | 7 |
| | 2.5 | විගණන ප්‍රවේශය | 7 |
| | 2.6 | ප්‍රධාන විගණන අරමුණ හා නිර්ණායක | 8 |
| 3. | | ප්‍රධාන විගණන නිරීක්ෂණ | |
| | 3.1 | සංවිධාන ව්‍යුහය | 9 |
| | 3.2 | වැඩසටහන සඳහා සහල් මෝල් හිමියන් තෝරාගැනීම සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය තීරණය කිරීම | 10 |
| | 3.3 | ප්‍රතිපාදන ලබාදීම | 13 |
| | 3.4 | ණය මුදල් නැවත පියවීම | 15 |
| | 3.5 | ණය සහන වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 16 |
| | 3.6 | සම්බන්ධිත ආයතන මගින් ඉටු කරන කාර්යයන් | 31 |
| | 3.7 | වැඩසටහනේ සමස්ථ කාර්ය සාධනය | 42 |
| 4. | | නිර්දේශ | 49 |
| | | ඇමුණුම් | 52 |

## 01. විධායක සාරාංශය

ශ්‍රී ලාංකික ජනතාවගේ ප්‍රධාන ආහාරය වන බත සපයන වී භෝගය ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භෝගයක් වේ. අප රටෙහි වාර්ෂික සහල් අවශ්‍යතාවය මෙ.ටො.මිලියන 2.4 ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇති අතර එය ආසන්න වශයෙන් වී මෙ.ටො.මිලියන 3.6 ක් පමණ වේ. 2018/19 මහ කන්නයට පෙර කන්න හතර තුළ පැවති නියඟය හේතුවෙන් වී නිෂ්පාදනය අඩුවීම ගොවියාට මෙන්ම පාරිභෝගිකයාටද අහිතකර ලෙස බලපා තිබුණි. එසේම වසර 2000 වන විට ශ්‍රී ලංකාව තුළ සිටි 2000 ක් පමණ වූ සහල් මෝල් හිමියන්ගේ සංඛ්‍යාව වර්තමානය වන විට 800 ක පමණ ප්‍රමාණයකට අඩු වී තිබුණි. මේ නිසා සහල් නිෂ්පාදනය සීමිත පිරිසක් අතට පත්වී තිබෙන අතර සහල් වෙළඳපල තුළ කාර්ටලයාධිකාරී තත්ත්වයක් ගොඩ නැගී තිබුණි.

මෙම තත්ත්වයන්ට පිළියම් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ හාල් මෝල් හිමියන්ට ඉතා ඉක්මනින් ණය සහන ලබා දීම සඳහා වූ වැඩසටහන 2019 වර්ෂයේ පෙබරවාරි මස වන විට ආරම්භ කර තිබුණි. මෙම වැඩසටහන අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, කුරුණෑගල, පුත්තලම, මහනුවර, හම්බන්තොට සහ මඩකලපුව යන තෝරාගත් දිස්ත්‍රික්ක 8 ක ක්‍රියාත්මක කරන ලද අතර රජය විසින් වැඩසටහන සඳහා වෙන් කළ මුදල රු. බිලියනයක් විය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ සම්බන්ධිත ආයතන වන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය, ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යාංශය, මහ භාණ්ඩාගාරය, වැඩසටහනට සම්බන්ධ වන දිස්ත්‍රික් 08 ක දිස්ත්‍රික් ලේකම්වරු, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිති වේ.

රජය විසින් ආරම්භ කරන ලද මෙම වැඩසටහන මගින්, වී මිළදී ගැනීමේදී සාධාරණ මිලක් ඇති කිරීම් , සුළු හා මධ්‍ය පරිමාණ හාල් මෝල් හිමියන් නගා සිටුවීම හා සහල් නිෂ්පාදනය මහා පරිමාණ ව්‍යාපාරිකයන් කිහිපදෙනෙක් අත රැඳීමේ තත්ත්වය බිඳහෙලමින් පාරිභෝගිකයින් හට සාධාරණ මිළක් යටතේ සහල් මිළදී ගැනීමට අවස්ථාව සැලසීම යන බහුවිධ අරමුණු ඉටුවී තිබේද යන්න ඇගයීම මෙම විගණනයේ අරමුණු විය.

ඒ අනුව 2019 වර්ෂයේ මහ කන්නයේ ගොයම් කැපීම ආරම්භ කිරිමෙන් පසු මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා සිටීම හා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලැබී තිබීම, මධ්‍යම රජය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත හා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් සමිති වෙත නියමිත පරිදි වී මිලදි ගැනීම සඳහා අරමුදල් ලබාදීමේ කාල ප්‍රමාදයන් සිදුව තිබීම, වැඩසටහන සඳහා මෝල් හිමියන් තෝරාගැනීමේ මෙන්ම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා තීරණය කිරීමේ ගැටළු පැවතීම, දිස්ත්‍රික් සමිති වෙත

ලබාදුන් අරමුදල් එහි සාමාජිකයන් අතර බෙදීයාමේ ගැටළු පැවතීම, වී මිලට ගැනීමේදී පොහොර නාම ලේඛනයේ නම සඳහන් නොවන ගොවීන්ගෙන් වී මිලට ගෙන තිබීම, ඇතැම් මෝල් හිමියන් විසින් අපේක්ෂිත සහල්ප්‍රමාණය සමිති වෙත භාරදීමට කටයුතු කර නොතිබීම, භාරදීමේ කාල ප්‍රමාදයන් පැවතීම හා සහල් අලෙවි කිරීමේ ක්‍රමවේදය පිළිබඳව වැඩසටහන ආරම්භයේදී අවධානය යොමු වී නොතිබීම විගණනයේදී ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය කරන ලදී.

එසේම, මෝල් හිමියන් විසින් නිෂ්පාදනය කරන ලද සහල් සඳහා සමිති විසින් නියමිත පරිදි කෙටුම් කුලී ගෙවා නොතිබීම , සාමාජික මෝල් හිමියන් විසින් බැංකු වෙත එතෙක් ඔවුන් විසින් ගෙවිය යුතුව පැවති ණය වාරික ගෙවීමට කටයුතු කර නොතිබීම හෝ ණය වාරික ගෙවීම් ඉතා අවම මට්ටමක පැවතීම වැනි කරුණුද විගණනයේදී නිරීක්ෂණය කරන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ වැඩසටහන සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමය වෙත පැවරී ඇති කාර්යභාරය වන්නේ ආහාර කොමසාරිස් මගින් සකස් කරන ලද පරිගණක වැඩසටහනට අවශ්‍ය දත්ත සැපයීම වුවත්, මෙම සංගමය විසින් නිසියාකාරව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම මෙම වැඩසටහන තුල මෙතෙක් දිස්ත්‍රික් සමිති වෙත නිකුත් කරන ලද වැඩිම මුදල වන රු.මිලියන 206 ක මුදල සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතියේ සභාපතිවරයා නියෝජනය කරන පොලොන්නරුව දිස්ත්‍රික් සමූපකාර සමිතිය වෙත ගෙවා තිබූ බව නිරීක්ෂණය වූ අතර පොලොන්නරුව දිස්ත්‍රික් සමිතියේ සභාපතිවරයා විසින් ඔවුන්ගේ පෞද්ගලික අභිමතය පරිදි එක් එක් මෝල් හිමියාට වී මිලදී ගැනීම සඳහා එම ණය මුදල භාවිතා කර තිබුණි.ඊට අමතරව ඒ ඒ දිස්ත්‍රික් සමිති වෙත රජය විසින් ලබාදුන් අරමුදල් සමිති විසින් නියමිත කාලය තුළ පියවීමට කටයුතු කර නොතිබීම, වැඩසටහන නියාමනය සඳහා අවශ්‍ය දත්ත පද්ධතිය සඳහා අවශ්‍ය දත්තයන් සාමාජික මෝල් හිමියන් විසින් නිසි පරිදි ලබා දීමට කටයුතු කර නොතිබීම, යන ගැටළු තුළින් අනාවරණය වූයේ රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස රජයේ මුදල් වැය කරමින් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම වැඩසටහන සඳහා දායක විය යුතු එක් එක් රාජ්‍ය ආයතන වල වගකීම ඉටු කිරීම පැහැර හැරීම හෝ ප්‍රමාණවත් පරිදි ඉටු වී නොතිබුණු බවය. ඒ හේතුවෙන් අදාල වැඩසටහන් අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීමට නොහැකි වීම තුල එහි ප්‍රතිලාභ එම ක්ෂේත්‍රය තුළ නියැලී සිටින කර්මාන්තකරුවන්ට මෙන්ම පාරිභෝගිකයින්ට ලඟා කරගැනීමට අවස්ථාව නොලැබී තිබුණි.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි සාමාජික සමිති විසින් වී මිලට ගැනීම, සහල් විකිණීම, කාරක ප්‍රාග්ධන මුදල් සාමාජිකයන්ගේ බැංකු ගිණුම් වලට ප්‍රේෂණය කිරීම, සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සංගමය විසින් දිස්ත්‍රික් සමිති වෙත සිදු කරනු ලබන මැදිහත් වීම් දිස්ත්‍රික් සමූපකාර සහකාර කොමසාරිස්වරයාගේ පූර්ණ හා නිරන්තර අධීක්ෂණයටත් ලක් විය යුතුය.එසේම ප්‍රමාදයකින් තොරව වී මිලදී ගැනීම සඳහා අදාල මුදල් කල් වේලා ඇතිව සමිති වෙත නිකුත් කිරීම, වී අලෙවි මණ්ඩල ගබඩා ධාරිතාව උපරිම ප්‍රයෝජන ගත හැකිවන පරිදි වී මිලදී ගැනීමටත් ඒවා සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ලබා දීමටත් දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් කටයුතු කිරීම කළ යුතුය.

ණය මුදලක් ලෙස මෙම ප්‍රතිපාදන සාමාජිකයන්ට ලබා දීමට කටයුතු කිරීම වෙනුවට, නිෂ්පාදනය කරනු ලබන සහල් ප්‍රමාණය මත පමණක් අදාළ මුදල් ප්‍රමාණය ගිවිසුම් ප්‍රකාරව ලබ දිය යුතු වීම හා දිස්ත්‍රික් සමිති සඳහා ලබාදෙන ණය මුදල් ගිවිසුම් කාලය අවසානයේදී නැවත පියවීමට කටයුතු නොකරන මෝල් හිමියන් සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.එමෙන්ම අදාල දිස්ත්‍රික් සමිති විසින් රජය තීරණය කරන උපරිම සිල්ලර මිල යටතේ ඒ ඒ දිස්ත්‍රික් මට්ටමේ විවිධ සේවා සමූපකාර සමිති හරහා සතොස ප්‍රාදේශීය අලෙවි සැල් හරහා සහල් අලෙවි කල යුතු බවත් වෙළඳපලෙහි සහල්මිල පිළිබඳ නිරන්තර පසු විපරම් ක්‍රියාවලියක් හා ඊට අනුරූපීව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවත් නිර්දේශ කෙරේ.

ශ්‍රී ලංකාවේ වාර්ෂික සහල් අවශ්‍යතාවයෙන් සියයට 0.5 ක ප්‍රමාණයක් පමණක් මෙම වැඩසටහන හරහා සපයා තිබීම හා ඊට සමගාමීව රජය විසින් සහල් සඳහා උපරිම සිල්ලර මිලක් පනවා සහල් මිල අඩු කිරීම සම්බන්ධයෙන් කරන ලද ඍජු මැදිහත්වීම මත 2019 අවසන් කාර්තුව වන විට වෙළඳපොලෙහි සහල් මිල පෙර පැවති මිලට වඩා අඩුවී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවද තිරසාර ලෙස සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නගා සිටුවමින්, සහල් වෙළඳපල පාලනය කිරීම තුලින් සියලු පාර්ශව වෙත ප්‍රතිලාභ ලබා ගත හැකි මෙවැනි වැඩසටහන් ශක්තිමත්ව කරගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය විය යුතුය.

## 2. හැඳින්වීම

### 2.1 පසුබිම


පසුගිය කන්න 4 ක් තුළ පැවති නියං තත්වය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබීම එම කන්නවල වී නිෂ්පාදනය විශාල වශයෙන් අඩු වීමට හේතු වී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සහල් නිෂ්පාදනයේ සිදු වූ අඩුවීම ගොවියාට මෙන්ම පාරිභෝගිකයාටත් අහිතකර ලෙස බලපා තිබුණි.හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ලබා ගත් දත්ත අනුව 2019 ජනවාරි මස වන සිට වෙළඳපොලෙහි සහල් තොග මිල නාඩු කි.ග්‍රෑ 1 ක් රු.94.00 ක්ද සම්බා කි.ග්‍රෑ 1 ක් රු.112.00 ක්ද දක්වාද ඉහළ ගොස් තිබුණි. වෙළඳපොළ තුළ සහල් නිෂ්පාදකයන් සීමිත ගණනක් බිහිවී තිබීම මෙසේ සහල් මිල කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

2019 පෙබරවාරි 11 දින ඉදිරිපත් කරන ලද අංක PS/HC-4/CP/41/2019 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති පරිදි ,වසර 2000 දී ශ්‍රී ලංකාව තුළ සිටි 2000 ක් පමණ වූ හාල් මෝල් හිමියන් සංඛ්‍යාව ඔවුන් විසින් කර්මාන්තය කරගෙන යාමේදී මුහුණපාන ලද විවිධ හේතූන් මත වර්තමානය වන විට සංඛ්‍යාත්මකව 800 ක් පමණ වූ පිරිසකට සීමා වී තිබේ. ඔවුන් විසින් ලබාගෙන ඇති ණය වාරික පියවීමේ නොහැකියාව සහ ප්‍රමාණවත් පරිදි කාරක ප්‍රාග්ධනයක් නොමැතිවීම එම මෝල් හිමියන් මුහුණපා ඇති ප්‍රධානම මූල්‍ය දුෂ්කරතා වේ. ඔවුන්ගේ මෙම අකර්මන්‍යවීම වෙළඳපොලෙහි සහල් නිෂ්පාදනය සීමිත පිරිසක් සතුවීමට හේතු වී ඇතුවාක් මෙන්ම එය සහල් මිල අහිතකර ලෙස ඉහළ යාමටද හේතු වී තිබේ.

ඒ අනුව සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නගා සිටුවීම මගින් සහල් වෙළඳපොල තුළ තරගකාරිත්වයක් නිර්මාණය කිරීමත් එමගින් සහල්වල සිල්ලර මිල ස්ථායි කිරීමත් වී ගොවීන් සඳහා සාධාරණ මිලක් ලබාදීමත් කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් නගා සිටුවීම මගින් වී ගොවියන් සඳහා සාධාරණ මිලක් ස්ථාපිත කිරීමටත් පාරිභෝගිකයන් සඳහා සාධාරණ සිල්ලර මිලක් ඇති කිරීමත් අපේක්ෂා කර ගනිමින් ගරු ජනාධිපතිවරයා විසින් 2019 ජනවාරි මස 11 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලත් අනුමැතිය ප්‍රකාරව සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට ඉතා ඉක්මනින් ණය සහන ලබාදීම නම් වූ මෙම වැඩසටහන ආරම්භ වී තිබේ.

මෙහිදී ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වී අලෙවි මණ්ඩලය, සමූපකාර සංවර්ධන කොමසාරිස්, රජයේ හා පෞද්ගලික බැංකු මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සමඟ සාකච්ඡා කොට තිරසර ක්‍රමවේදයක් යෝජනා කොට ඇත. මෙම සාකච්ඡාවන් ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයුම් අමාත්‍යාංශය විසින් කලින්කල සිදුකළ ක්‍රියාකාරකම්වල දිගුවකි.

ඒ අනුව පොළොන්නරුව, අනුරාධපුරය, හම්බන්තොට, අම්පාර, මඩකලපුව, මහනුවර, කුරුණෑගල, පුත්තලම යන දිස්ත්‍රික්ක ඉලක්ක කර ගනිමින් මෙම ණය සහන ලබාදීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ. මෙම දිස්ත්‍රික්ක 08 තුළ සිටින සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් 228 ක් මෙම ණය සහන යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබනු ලැබේ. මෙම මෝල් හිමියන් ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටුවා ගත් දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිති හරහා ණය සහන යෝජනා ක්‍රමයට අයත් ගනුදෙනු සිදු කරනු ලබන අතර රජය විසින් පිළියෙල කරන ලද ගිවිසුම් පත්‍රයක් ඔස්සේ දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය එකඟ වූ කොන්දේසි යටතේ පෞද්ගලිකව හා සාමුහිකව වගකීමට බැඳෙන ලෙස තුන්වන පාර්ශවය ලෙස ණය සහන යෝජනා ක්‍රමය සඳහා සම්බන්ධ කරගෙන තිබේ. අදාළ ගිවිසුමේ පළමු පාර්ශවය ඒ ඒ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් වන අතර දෙවන පාර්ශවය කොට්ඨාශ භාර දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වේ.


සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්වෙත ණය සහන ලබා දීමේ වැඩසටහන
කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය
ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම හා ලබාදීම
දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන කොමසාරිස්
පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්
දිස්ත්‍රික් ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශයේ
මහා භාණ්ඩාගාරය
සී/ස සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය
- බැංකු ගිණුමක් පවත්වා ගැනීම
- ප්‍රතිපාදන අවශ්‍යතාවය පළාත් සමුපකාර කොම. නිර්දේශය සහිතව දිස්ත්‍රික් ලේකම් වෙත එවීම
- සමිතියේ ගිණුමට මුදල් බැර කිරීම
නෛතික ගිවිසුම
ගිවිසුම 01
ගිවිසුම 02
ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයුම් අමාත්‍යාංශය විසින් නෛතික ගිවිසුම සකස් කිරීම
සී/ස සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය හා එහි සාමාජිකයන් අතර
දිස්ත්‍රික් ලේකම්
සහල් නිෂ්පාදනය පිළිබඳ වැඩසටහන් යෝජනාව පිළියෙල කිරීම හා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය
දිස්.සමුපකාර සහකාර කොමසාරිස්
මෝල් හිමියන් සඳහා ජීවිත රක්ෂණයකටද තොග සඳහා රක්ෂණාවරණයකටද යටත් විය යුතුය.
දිස්.සහල්මෝල් හිමියන්ගේ සමිති
වී මිලදී ගෙන සහල් බවට පත්කිරීම හා අලෙවි කිරීම
මෝල් හිමියන් විසින් වී මිලදී ගැනීම
-සහනාධාර පොහොර වැඩසටහනෙහි ගොවි නාම ලේඛනයේ ලියාපදිංචි ගොවීන්ගෙන් මී මිලදී ගැනීම
-රජයේ පිළිගත් ප්‍රමිතියට අනුකූල වීම
-අවම වශයෙන් රජයේ සහතික වී මිල සලකා බැලීම
කෙටුම් කුලී ගෙවීම
ගිවිසුම ප්‍රකාරව කෙටුම් කුලියෙන් කොටසක් මෝල් හිමියාගේ මාසික බැංකු ණය වාරිකයට ගෙවීම හා ඉතිරිය මෝල් හිමියාට ගෙවීම
ප්‍රතිපාදන නැවත පියවීම
පියවීම
දිස්ත්‍රික් ලේකම් නිදහස් කරන ප්‍රතිපාදන මුදල මාස 06 ක් අවසන් වූ වහාම සමුපකාර සමිතිය විසින් දි.ලේ.ට පියවීම
සහල් විකිණීම
-මෝල් හිමියා විසින් සහල් නිෂ්පාදනය කළ විගස සී/ස සහල් නි.සමු.සමිතිය විසින් භාරගැනීම හා ආරක්ෂිතව ගබඩා කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම
-විකුණුම් ආදායම අදාළ බැංකු ගිණුමට බැර කිරීම
නොපියවීම
දිස්ත්‍රික් ලේකම් විසින් ගිවිසුම ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගැනීම
ණය සහන ලබාදීමට අදාල ක්‍රමවේදය සැකසීම
ආර්ථික ප්‍රතිසංස්කරණ පොදු සැපයුම් අමාත්‍යාංශය
ණය සහන ලබා දීමට අදාළ මාර්ගෝපදේශ සැකසීම
අධීක්ෂණය හා මෙහෙයවීම
ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීමේ කැබිනට් නොවන අමාත්‍යාංශයේ සභාපතීත්වය දරන කෘෂිකර්ම අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය , කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක්
කෘෂිකර්ම අමාත්‍යාංශය
මහා භාණ්ඩාගාරයෙහි ණය පියවීම සඳහා දෙවන පාර්ශවය හා එක්ව අධීක්ෂණ කටයුතු මෙහෙයවීම
දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහ.කොම
සමු.කොම.උපදේශක සමිති විසින් සිදු කරන සහල් මිලදී ගැනීමේ හා අලෙවි කිරීම් අධීක්ෂණය
සමුපකාර සංවර්ධන කොමසාරිස්
සහල් නිපදවන්නන්ගේ මහා සංගමය
ආහාර කොමසාරිස්
වැඩසටහනේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා දත්ත පද්ධතිය නඩත්තු කිරීම
සමිතිවලට අදාළ දත්ත සැපයීම

## 2.2 විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3(1)ඈ, 5(2), 12(ඌ) වගන්ති අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 2.3 විගණනය සඳහා මාතෘකාව තෝරා ගැනීමට හේතු

ශ්‍රී ලංකාව තුළ සහල් නිෂ්පාදනයෙහි නියැලී සිටි සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී ගොස් සහල් නිෂ්පාදනය පුද්ගලයින් කිහිපදෙනෙකු අතට පත්වීම , වී නිෂ්පාදකයන්ට මෙන්ම සහල් පාරිභෝගිකයාටත් අහිතකර ලෙස බලපා තිබීම විගණනය සඳහා මෙම මාතෘකාව තෝරා ගැනීමට හේතු විය.

## 2.4 විගණන ක්‍රමවේදය

මෙම කාර්යසාධන විගණනය සිදු කිරීමේදී පහත සඳහන් ක්‍රමවේදයන් අදාළ කර ගන්නා ලදී.

(අ) අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සහ තීරණ පරිශීලනය

(ආ) අදාළ ගිවිසුම් පරිශීලනය

(ඇ) ජීවන වියදම් කමිටු තීරණ ඇතුළුව අනෙක් අදාළ රාජ්‍ය ආයතනවල ප්‍රතිපත්ති, තීරණ හා තොරතුරු පරිශීලනය

(ඈ) සහල් නිෂ්පාදකයන්ගේ සමිති වෙත ගොස් සාමාජිකයන් මුණ ගැසී තොරතුරු ලබා ගැනීම

## 2.5 විගණන ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සංඛ්‍යාව වාර්ෂිකව අඩුවී යාම නිසා සහල් වෙළඳපොළ තුල වී මිළදී ගන්නන් කිහිප දෙනෙක් විසින් කතිපයාධිකාරීත්වයක් නිර්මාණය කර තිබීම රජයට ගැටළුවක් වී තිබුණි.එම ගැටළුව අවම කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවනු ලැබූ සමුපකාර සමිති හරහා ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ දායකත්වය ලබාගැනීම සහ ඒ තුලින් සහල් වෙළඳපොලේ කතිපයාධිකාරීත්ව මට්ටම අවම කිරීමත් ,ගොවියාට වී සඳහා සාධාරණ

මිළක් ලැබිම හා පාරිභෝගිකයාට සහනදායී මිළකට සහල් ලබාගැනීමට හැකිවීම තුලින් සහල් වෙළඳපොලේ ප්‍රශස්ථ භාවයක් ඇතිකිරීම සඳහා ක්‍රියාත්මක වූ මෙම වැඩසටහනේ පාර්ශවකරුවන් ලෙස විවිධ රාජ්‍ය ආයතන, සමිති සමාගම් වල කාර්යභාරය නිශ්චිතව හඳුනාගත හැකිවිය. ඒ අනුව එම කාර්යභාරයන් වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණු ළඟාකරගැනීම වෙනුවෙන් අවශ්‍ය පරිදි ඉටුවන්නේද යන්න ඇගයීම පිණිස මෙම මාතෘකාව යටතේ කාර්යසාධන විගණනයක් සිදුකිරීමට අපේක්ෂා කෙරුණි.

## 2.6 ප්‍රධාන විගණන අරමුණ හා නිර්ණායක

සුළු හා මධ්‍ය පරිමාණ සහ සහල් මෝල් හිමියන්ට ණය සහන ලබාදීමේ වැඩසටහන මගින් අපේක්ෂිත අරමුණු ලගාකරගෙන තිබේද යන්න ඇගයීම.

**විගණන නිර්ණායක**

(i) වැඩසටහන ආරම්භ වීමෙන් පසු මෝල් හිමියන් විසින් අඛණ්ඩව නිෂ්පාදන ක්‍රියාවලියෙහි නිරතව සිටීම.

(ii) සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ගේ නිෂ්පාදන ධාරිතාවය හා ගබඩා පහසුකම්.

(iii) අංක 19/0549/101/030 හා 2019.02.11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඊට අදාළ 2019.02.12 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය

(iv) දිස්ත්‍රික් ලේකම්, කොට්ඨාශ භාර දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් හා දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති සමග ඇති කරගත් ගිවිසුම

(v) දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය හා සහල් මෝල් හිමියන් සමග ඇතිකරගත් ගිවිසුම

(vi) ජීවන වියදම් කමිටු රැස්වීම් තීරණ

(vii) කෘෂිකර්ම ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අංක 4/3/11-4 දරන හා 2019.03.20 දිනැති මාර්ගෝපදේශය

(viii) රජයේ මුදල් රෙගුලාසි

(ix) සහල් සම්බන්ධ පාලන මිල

## 3. ප්‍රධාන විගණන නිරීක්ෂණ

### 3.1 සංවිධාන ව්‍යුහය

(අ) මෙම ණය සහන යෝජනා ක්‍රමයට සම්බන්ධ වන ප්‍රධාන පාර්ශවයන් සහ ඒවායේ කාර්යභාරයන් පහත පරිදි වේ.

| | පාර්ශවය | කාර්යභාරය කෙටියෙන් |
|---|---|---|
| (i) | කෘෂිකර්ම අමාත්‍යාංශය (ලේකම්) | පූර්ණ මෙහෙයවීම |
| (ii) | වැඩසටහනට සම්බන්ධ වන දිස්ත්‍රික් 08 ක අදාල දිස්ත්‍රික් ලේකම්වරු | මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන අරමුදල් දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිති වෙත ලබාදීම හා එම මුදල් මාස 06 පිරුණු වහාම අදාල සමිති මගින් අයකරගෙන නැවත මහා භාණ්ඩාගාරය වෙත පියවීම. |
| (iii) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්) | දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිති විසින් සිදු කෙරෙන කටයුතු අධීක්ෂණය |
| (iv) | ආහාර කොමසාරිස් | පරිගණක ගත දත්ත පද්ධතිය පවත්වාගෙන යාම හා පූර්ණ අධීක්ෂණය |
| (v) | දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති | i. රජය විසින් ලබා දුන් මුදල එසේ ලබාදුන් දින සිට මාස 06 ක් කල් පිරුණු විට දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් හා දිස්ත්‍රික් ලේකම් හරහා නැවත මහා භාණ්ඩාගාරය වෙත ගෙවීම.<br>ii. සාමාජික මෝල් හිමියන් මගින් සහල් නිෂ්පාදනය කිරීම.<br>iii. සමිති විසින් සැලසුම් කරගෙන ඇති ආකාරයට රජයේ අවම සහතික මිල යටතේ අලෙවි කිරීම, සමාජිකයන් වෙත කෙටුම් කුලී ගෙවීම |

**(ආ) අදාළ ආයතන විසින් කාර්යභාරයන් ඉටු කිරීම**

ඉහත සඳහන් ආයතනයන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය සහන ලබාදීමේ වැඩසටහනට අදාළව සිදු කරන ලද කාර්යභාරයන් අදාළ නෛතික ගිවිසුම් හා මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉටු කර තිබේද යන්න ඇගයීමේදී එකී පාර්ශවයන් විසින් අදාළ කාර්යභාරයන් ප්‍රමාණාත්මක පරිදි ඉටු නොකරන ලද අවස්ථාවන් වාර්තාවේ ඉදිරියේදී සාකච්ඡා කෙරේ.

## 3.2 වැඩසටහන සඳහා සහල් මෝල් හිමියන් තෝරා ගැනීම සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය තීරණය කිරීම

උක්ත වැඩසටහන සඳහා අදාළ වන මාර්ගෝපදේශයට අනුව සහල් මෝල් හිමියන්ට සපයනු ලබන කාරක ප්‍රාග්ධන ප්‍රමාණය එම මෝල් හිමියන්ගේ ණය ප්‍රමාණය, සහල් මෝල් වල ධාරිතාවය හා පහසුකම් සලකා බලා දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් හෝ කොට්ඨාශ භාර සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් තීරණය කළ යුතු වේ. ඒ තීරණයන් අනුව සුළු හා මධ්‍ය පරිමාණ හාල් මෝල් හිමියන්ට ණය සහන ලබාදීමේදී පළාත් 5 ක පිහිටි දිස්ත්‍රික්ක 8 ක සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිවල සාමාජිකයන් 228 සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය රු.මිලියන 1,215 ක් ලෙස ඇස්තමේන්තු කර සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර සමුපකාර කොමසාරිස් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත සමිති 8 සඳහා රු.මිලියන 1,215 ක් ඉල්ලුම් කර තිබූ නමුත් රජය විසින් මෙම වැඩසටහන සඳහා අනුමත කර තිබුණේ රු.මිලියන 1000 ක් පමණි. විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික් සමුපකාර සමිතියේ නම | සාමාජික සංඛ්‍යාව | ඉල්ලුම් කරනු ලබන මුදල රු.මිලියන | රජයෙන් වෙන්කළ මුදල රු.මිලියන |
|---|---:|---:|---:|
| සී/ස කුරුණෑගල දිස්ත්‍රික් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 16 | 90 | 65 |
| සී/ස පුත්තලම දිස්ත්‍රික් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 39 | 120 | 80 |
| සී/ස අනුරාධපුර දිස්ත්‍රික් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 26 | 200 | 140 |
| සී/ස පොලොන්නරුව දිස්ත්‍රික් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 58 | 400 | 425 |
| සී/ස අම්පාර දිස්ත්‍රික් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 13 | 25 | 20 |
| සී/ස මඩකලපුව දිස්ත්‍රික් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 14 | 150 | 100 |
| සී/ස මහනුවර දිස්ත්‍රික් සමුපකාර සමිති නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 13 | 30 | 20 |
| සී/ස හම්බන්තොට දිස්ත්‍රික් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 49 | 200 | 150 |
| | 228 | 1,215 | 1,000 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) පොලොන්නරුව දිස්ත්‍රික්කය**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2019 මාර්තු 20 දින නිකුත් කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය සහන ලබා දීමට අදාළ ක්‍රමවේදය පිළිබඳ මාර්ගෝපදේශය ප්‍රකාරව සමිතියේ සාමාජිකත්වය දරන එක් එක් සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ගේ ණය බර, නිෂ්පාදන ධාරිතාවය හා ණය ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගෙන සම්පූර්ණ ණය මුදල තීරණය කර රජය විසින් දිස්ත්‍රික් ලේකම් හරහා ණය මුදල දිස්ත්‍රික් සමුපකාර සමිතිවලට නිදහස් කර තිබුණි. ඒ අනුව වැඩසටහන තුළ දිස්ත්‍රික් සමිති වෙත නිකුත් කරන ලද වැඩිම මුදල වන රු. මිලියන 206 ක ප්‍රමාණය පොලොන්නරුව දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිතිය වෙත නිකුත් කර තිබුණි. නමුත් පොළොන්නරුව දිස්ත්‍රික් සමුපකාර සමිතියේ සභාපතිවරයා විසින් ඔහුගේ පෞද්ගලික අභිමතය පරිදි එක් එක් මෝල් හිමියාට වී මිලදී ගැනීම සඳහා ණය මුදල භාවිතා කර තිබුණි.මෙම පොළොන්නරුව දිස්ත්‍රික් සමුපකාර සමිතියේ සභාපතිවරයා දිවයිනේම සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නියෝජනය කරන සමිතියේ සභාපතිවරයාද වේ.

**(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කය**

හම්බන්තොට දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමිතියට 2019 අප්‍රේල් 05 දින වන විට ලැබී තිබූ රු. මිලියන 38 කින් සියයට 48 ක ප්‍රමාණයක් එම සමිතියේ මුළු සාමාජිකයන් 15 දෙනා අතරින් සාමාජිකයින් 03 දෙනෙකු අතර, වී මිලදී ගැනීම සඳහා ලබා දී තිබුණි. මෙම සාමාජිකයින් සමිතියේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික වැනි තනතුරු දරන්නන් වන අතර අනෙකුත් සාමාජිකයින් ණය සහන නොලැබීමට සුදුසුකම් සපුරා නොසිටින බවට තහවුරු නොවුණි.

**(ඇ) මහනුවර දිස්ත්‍රික්කය**

සුළු හා මධ්‍ය පරිමාණ සහල් නිෂ්පාදකයන් සඳහා සහන සැලසීමේ වැඩසටහන යටතේ ණය මුදල් ඉල්ලුම් කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතු විය. එය සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය මගින් සකස් කළ යුතු බව 2019 ජනවාරි 12 දින සංගමය මගින් සී/ස මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමයට නිකුත් කළ ලිපියේ සඳහන් කර තිබුණි.මේ පිළිබඳව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i. මෙම ව්‍යාපෘති වාර්තාව ලබාගැනීමට අදාළ රු.30,000 ක මුදල 2019 ජනවාරි 17 දින සීමාසහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය විසින් ලබාගෙන තිබුණි. මෙම ව්‍යාපෘති වාර්තාවට අනුව සමිතිය සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය මිලියන 30 ලෙස දක්වා තිබුණද එක් එක් වී මෝල් හිමියන් අතර අරමුදල් බෙදීයාම පිළිබඳව විස්තර ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය සහන ලබාදීමට අදාළ ක්‍රමවේදය පිළිබඳව මාර්ගෝපදේශ අංක 01 හි සඳහන්ව නොමැති කොන්දේසියක් ලෙස අරමුදල් සඳහා අපේක්ෂිත පොලී අනුපාතය සියයට 12 ලෙසද දක්වා තිබුණි.

ii. 2019 නොවැම්බර් 05 විගණිත දිනය වන විටද සාමාජිකයන්ගේ ණය ශේෂ පිළිබඳව තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට අදාළ තොරතුරු අදාළ බැංකු මගින් ලබාගෙන නොතිබුණි.

iii. සහල් මෝල් හිමියන් විසින් බැංකුවලට ගෙවීමට ඇති ණය ප්‍රමාණය සලකා, සාමාජිකයන්ගේ සහල් මෝල් පරීක්ෂා කර ,එම සහල් මෝල් ධාරිතාවයද සලකා එම මෝල් හිමියන් සඳහා සුදුසු කාරක ප්‍රාග්ධන ප්‍රමාණය නිර්ණය කළ යුතු නමුත්, සී/ස මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සිමිතියේ සාමාජිකයන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය තීරණය කිරීමේදී මහනුවර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් සාමාජිකයන්ගේ සහල් මෝල් පරීක්ෂා කර එම සාමාජිකයන්ගේ සහල් මෝල් ධාරිතාවය පමණක් සලකා බලා තිබූ බවත් , එම සහල් මෝල් හිමියන් විසින් බැංකුවලට ගෙවිය යුතු ණය මුදල් ප්‍රමාණය පිළිබඳව සැලකිල්ලට ගෙන නොතිබූ බවත්, නිරීක්ෂණය විය.

iv. සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය සහන ලබා දීමට අදාළ ක්‍රම වේදය පිළිබඳ මාර්ගෝපදේශය අනුව අවශ්‍ය කාරක ප්‍රාග්ධන ප්‍රමාණය තීරණය කිරීමේදී ණය ප්‍රමාණය හා ධාරිතාවය සළකා බලනු ලැබුවේ නම් කාරක ප්‍රාග්ධනය බෙදී යා යුතු ප්‍රතිශතය හා මහනුවර සමුපකාර සංවර්ධන සහකාර කොමාසරිස් විසින් ලබා දී ඇති ප්‍රතිශතය සලකා බැලීමේදී සාමාජිකයන් තිදෙනෙකු අතර සියයට 5.36 සිට 19.52 දක්වා වූ කැපී පෙනෙන විචලනයන් පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

## 3.3 ප්‍රතිපාදන ලබාදීම

(අ) සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ණය සහන ලබාදීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිති වෙත නියමිත ප්‍රතිපාදන ලබාදීමේදී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරයෙන් අදාළ ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම කරනු ලබන අතර, මහා භාණ්ඩාගාරය වෙතින් එසේ ලැබෙන ප්‍රතිපාදන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා අදාළ සමිති වෙත ලබාදීම කරනු ලැබේ.

ඒ අනුව මෙම වැඩසටහන යටතේ රජය විසින් අදියර කිහිපයක් යටතේ දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිති වෙත ණය සහන ලබාදීමට කටයුතු කර තිබූ අතර මෙම මුදල දිස්ත්‍රික් ලේකම්වරයා, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් සහ දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිති අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් සමිති වෙත ලැබුණු දින සිට මාස 06 ක් කල්පිරුණු කල දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් හා දිස්ත්‍රික් ලේකම්වරයා හරහා මහා භාණ්ඩාගාරයට පියවීමට කටයුතු කළ යුතුවේ.

(ආ) මෙම වැඩසටහන සඳහා රු.මිලියන1000 ක් වෙන් කර තිබූ අතර ඉන් විගණිත කාලපරිච්ඡේදය තුල (2019 නොවැම්බර් මස 01 දින වන විට) ලබා දී තිබූ මුළු මුදල රු.මිලියන 434.87 ක් විය.

| දිස්ත්‍රික් සමුපකාර සමිතියේ නම | ලබාදුන් මුදල (රු.මිලියන) |
| --- | --- |
| සී/ස කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 16 |
| සී/ස පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 64 |
| සී/සඅනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 59.87 |
| සී/ස පොලොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 206 |
| සී/ස අම්පාර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 16 |
| සී/ස මඩකලපුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 25 |
| සී/ස මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 10 |
| සී/ස හම්බන්තොට දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 38 |
| | ---------- |
| එකතුව | 434.87 |

මෙම මුදලින් රු.මිලියන 147.87 ක ප්‍රතිපාදනයන් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලැබූ දිනයන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් සමිති වෙත ලබාදීමේදී දිස්ත්‍රික් සමිති 05 ක දින 21 සිට දින 87 දක්වා වූ සැලකිය යුතු කාල පමාවක් පැවති බව නිරීක්ෂණය විය. මෙම ප්‍රමාදයන් සඳහා බලපාන ලද හේතු ලෙස වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 පෙබරවාරි 12 දින වන විට ලැබී තිබුණද මාර්ගෝපදේශයන් ඇතැම් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලැබීමේ ප්‍රමාදවීම් සහ මාර්ගෝපදේශයන්හි සඳහන් ඇතැම් ක්‍රියාකාරකම් ඉටු කිරීමේ ප්‍රමාදයන් මෙන්ම ඇතැම් දිස්ත්‍රික් සමිති විසින් නියමිත පරිදි ලිපි ලේඛන භාරදීමට කටයුතු කර නොමැති වීම  යන කරුණු බලපා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ඉතා ඉක්මනින් ණය සහන ලබාදී ඔවුන් නගා සිටුවීම වුවත් මෙසේ දිස්ත්‍රික් ලේකම්වරුන් අත මුදල් රැඳී තිබීම හේතුවෙන් සහල් මෝල් හිමියන්ට නිසි වේලාවට වී මිලදී ගැනීමේදී අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන නොමැති වී තිබුණු බව ඇතැම් සමිති වෙතින් ලබා ගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 2019.11.01 දිනට මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන නිදහස් කිරීම් | | දිස්ත්‍රික් සමිති වෙත ප්‍රතිපාදන ලැබීම් | | මුදල් ලබාදීමේ ප්‍රමාදය දින |
|---|---|---|---|---|---|
| | දිනය | මුදල රු. මිලියන | දිනය | මුදල රු. මිලියන | |
| මඩකලපුව | 2019.03.18 | 25 | 2019.05.22 | 25 | 64 |
| කුරුණෑගල | 2019.03.11 | 16 | 2019.04.10 | 16 | 29 |
| අම්පාර | 2019.03.11<br>2019.07.09 | 5<br>11 | 2019.04.11<br>2019.08.15<br>2019.09.25 | 05<br>5.50<br>5.50 | 30<br>37 |
| අනුරාධපුර | 2019.03.11<br>2019.07.03 | 35<br>24.87 | 2019.04.17<br>2019.09.30 | 35<br>24.87 | 37<br>87 |
| පොලොන්නරුව | 2019.04.04 | 25<br>06 | 2019.04.25 | 31 | 21 |

## 3.4 ණය මුදල් නැවත පියවීම

ඉහත 3.3 (ආ) ඡේදයේදක්වා ඇති පරිදි දිස්ත්‍රික් සමිති වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන අදාල දින සිට මාස 6 ක් කල්පිරුණු කල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ආපසු ගෙවීමට අදාල දිස්ත්‍රික් සමිති කටයුතු කළ යුතු වුවද ,එම සමිති අතුරින් පොලොන්නරුව සමිතිය වෙත නිදහස් කළ රු.මිලියන 206 ක මුදලෙන් රු.මිලියන 67 ක මුදලක්ද හම්බන්තොට සමිතිය වෙත නිකුත් කරන ලද ප්‍රතිපාදන මුදල වූ රු.මිලියන 38 කින් රු.මිලියන 27.38 ක ප්‍රමාණයක්ද මහනුවර සමිතිය වෙත නිකුත් කරන ලද රු.මිලියන 10 ක මුදලින් රු.මිලියන 5 ක්ද වශයෙන් රු.මිලියන 434.87 කින් රු.මිලියන 99.38 ක් හෙවත් සියයට 22.85 ක් නියමිත කාල වකවානුව තුල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ගෙවීමට අදාල දිස්ත්‍රික් සමිති කටයුතු කර නොතිබූ අතර මාස 6 සම්පූර්ණ වන දිනට එහි ප්‍රමාද කාලය අවමය දින 5 සිට උපරිමය දින 35 විය. ඒ අනුව අදාල සමිති විසින් ගිවිසුම උල්ලංඝනය වන පරිදි මුදල් අනවශ්‍ය ලෙස අතරදවාගෙන සිටීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. ණය මුදල් නැවත පියවීමේදී සමිති විසින් ගිවිසුම් උල්ලංඝනය වන පරිදි කටයුතු කළ අවස්ථාවකදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ගිවිසුමේ 5(i) , 5(ii) හා 5(iii) ඡේද මගින්

දක්වා ඇත. මේ අනුව නැවත අයවිය යුතු මුළු ණය මුදල් ප්‍රමාණයෙන් ඉහළ ප්‍රතිශතයක් වාර්තා කරන හම්බන්තොට සහ පොළොන්නරුව දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිතිවලට එරෙහිව හම්බන්තොට හා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම්වරු අවශ්‍ය නීතිමය පියවර 2020 ජූලි 20 දින වන විට ගෙන තිබුණි.

## 3.5 ණය සහන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

### 3.5.1 වී මිලදී ගැනීම

#### 3.5.1.1 වී මිලදී ගැනීම සඳහා ණය ප්‍රතිපාදන යොදාගැනීම

මෙම වැඩසටහන සඳහා වෙන් කල මුළු මුදල රු.මිලියන 1000 ක් වන අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිති වෙත ලබා දී තිබූ මුළු මුදල වූ රු.මිලියන 434.87 චක්‍රීය ලෙස භාවිතා කරමින් දිස්ත්‍රික් සමිති විසින් නාඩු වර්ගයේ වී කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා රු.38 ක සහ සම්බා වර්ගයේ වී කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා රු.41 ක සහතික මිලක් යටතේ 2019 නොවැම්බර් 27 දිනට මිලදී ගෙන තිබූ වී වල වටිනාකම රු.මිලියන 691.57 ක් වූ අතර වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 16,000 (කිලෝ ග්‍රෑම් මිලියන 16) ක් විය. විස්තර පහත පරිදි විය.

| දිස්ත්‍රික්කය | ලබාදුන් ප්‍රතිපාදන රු. | ලබාගත් වී වල වටිනාකම රු. | වී ප්‍රමාණය කිලෝග්‍රෑම් |
|---|---|---|---|
| පොළොන්නරුව | 206,000,000 | 387,140,964 | 8,788,591 |
| අනුරාධපුර | 59,870,000 | 38,801,388 | 952,273 |
| මහනුවර | 10,000,000 | 19,383,374 | 471,110 |
| පුත්තලම | 64,000,000 | 113,412,975 | 2,615,955 |
| කුරුණෑගල | 16,000,000 | 28,554,134 | 685,223 |
| අම්පාර | 16,000,000 | 20,488,719 | 499,946 |
| හම්බන්තොට | 38,000,000 | 52,063,655 | 1,327,624 |
| මඩකලපුව | 25,000,000 | 31,728,487 | 758,396 |
| මුළු එකතුව | 434,870,000 | 691,573,696 | 16,099,118 |

**මූලාශ්‍රය -ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

### 3.5.1.2 පොහොර නාම ලේඛනයේ ලියාපදිංචි වූ ගොවීන්ගෙන් වී මිලදී ගත යුතුවීම.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 3 හි දක්වා ඇති පරිදි සී/ස සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය මගින් එක් එක් සාමාජික මෝල් හිමියා සමග එළඹි ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාරව රජය මගින් ක්‍රියාත්මක කරන සහනාධාර පොහොර වැඩසටහනෙහි ගොවි නාම ලේඛනයේ ලියාපදිංචි ගොවීන්ගෙන් සහතික මිලට වී මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. නමුත් මේ අනුව කටයුතු නොකරන ලද අවස්ථා 1,187 ක් දිස්ත්‍රික්ක 08 කදී අනාවරණය විය.

| **සමිතිය** | **පොහොර සහනාධාර වැඩසටහන යටතේ ලියාපදිංචි වී නොතිබුණු ගොවීන්ගෙන් වී මිලදී ගත් අවස්ථා ගණන** |
|---|---|
| පොලොන්නරුව | 602 |
| පුත්තලම | 350 |
| මහනුවර | 44 |
| අනුරාධපුර | 48 |
| අම්පාර | 17 |
| හම්බන්තොට | 63 |
| මඩකලපුව | 20 |
| කුරුණෑගල | 43 |
| | 1187 |

### 3.5.1.3 වී මිලදී ගැනීම සම්බන්ධ සමිති මට්ටමින් හඳුනාගන්නා ලද නිරීක්ෂණ

**(අ) මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතිය**

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව මහනුවර දිස්ත්‍රික්කයේ 2018/2019 මහ කන්නයේ හෙක්ටයාරයක සාමාන්‍ය වී අස්වැන්න වී කිලෝ 4,289 ක් වුවත් මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතියේ සාමාජිකයින් විසින් ගොවීන් 04 දෙනෙකුගෙන් වී මිලදී ගෙන ඇති වගා වපසරිය හා එලදාව සැසඳීමේදී කිලෝ 108,551 ක අසාමාන්‍ය වී මිලදී ගැනීමේ ගැනීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය.

**(ආ) පොලොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය**

පොලොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය විසින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව 2019 ඔක්තෝබර් 01 දිනට මෝල් හිමියන් 62 දෙනෙකු වෙනුවෙන් ණය මුදල් ලබාගෙන ඇතත්, එයින් 53 දෙනෙකු පමණක් වී මිලදීගෙන තිබුණි. ඒ අනුව ණය ලබාගත් මෝල් හිමියන් 09 දෙනෙකු විසින් ලබාගත් ණය මුදල අපේක්ෂිත අරමුණ වෙනුවෙන් යොදවා නොතිබුණි. එසේම මිලදීගත් රු. මිලියන 388 ක් වටිනා වී වලින් රු. මිලියන 292.6 ක් වටිනා වී මෝල් හිමියන් 19 දෙනෙකු වෙනුවෙන් මිලදීගෙන තිබූ අතර, මෙය මුළු වී මිලදී ගැනුම් වටිනාකමින් සියයට 75 ක් ඉක්මවනු ලබයි. ඉතිරි මෝල් හිමියන් 34 දෙනා අතර, රු. මිලියන 96 ක් වටිනා වී මිලදීගෙන තිබුණි. මෙම වී මිලදී ගැනීම සම්බන්ධව එක් එක් සාමාජිකයන් තෝරා ගත් පදනම ගැටළු සහගත වී තිබූ අතර ඒ බව දිස්ත්‍රික් සමුපකාර සමිතිය විසින් කරන ලද විමර්ශණයේදීද තහවුරු වී තිබුණි. මේ සඳහා පදනම් වූ කරුණු විගණනයට ඉදිරිපත් නොවීය.

### 3.5.2 සහල් නිෂ්පාදනය

#### 3.5.2.1 වී මිලදී ගැනීම හා නිපදවීමට අපේක්ෂිත සහල් ප්‍රමාණය

(අ) සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ඉක්මනින් ණය සහන ලබා දීමේ වැඩසටහන යටතේ රජය මඟින් සැපයෙන අරමුදල් යොදා ගනිමින් සුළු සහ මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් විසින් සහල් නිෂ්පාදන ක්‍රියාවලියෙහි නිරත විය යුතුවේ. එසේම ඔවුන් විසින් නිපදවනු ලබන සහල් තම සමිති වෙත ලබාදිය යුතු වේ. එසේම දිස්ත්‍රික් සමිති තම සාමාජිකයන් සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව සමිතිය විසින් සාමාජික සහල් මෝල් හිමියාට වී තොග සපයා දුන් දින සිට දින තුනක් (03) ක් ඇතුලත කැකුළු සහල්ද දින පහක් ඇතුලත (05) තැම්බූ සහල්ද භාරදීම කළ යුතු බව දක්වා තිබේ. මීට අදාළ නිරීක්ෂණ පහත පරිදි විය.

ආහාර කොමසාරිස්වරයා විසින් ලබාදුන් දත්ත අනුව 2019 නොවැම්බර් 27 දිනට මෙම වැඩසටහන යටතේ ලැබූ අරමුදල් උපයෝගී කර ගනිමින් ඒ ඒ සමිති විසින් මිලදී ගෙන තිබූ මුළු වි (සම්බා, නාඩු කැකුළු) ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 16,099,118 ක් වන අතර, එම වී මගින් ලබා ගෙන තිබූ සහල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 10,558,420 ක් විය. විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික් සමිතිය | වී ප්‍රමාණය කිලෝග්රෑම් | නිපදවන ලද සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් |
|---|---|---|
| පොලොන්නරුව | 8,788,591 | 6,668,330 |
| අම්පාර | 499,946 | 370,580 |
| කුරුණෑගල | 685,223 | 192,265 |
| හම්බන්තොට | 1,327,624 | 767,625 |
| මඩකලපුව | 758,396 | 440,920 |
| අනුරාධපුර | 952,273 | 297,435 |
| පුත්තලම | 2,615,955 | 1,559,700 |
| මහනුවර | 471,110 | 261,565 |
| එකතුව | 16,099,118 | 10,558,420 |

(ආ) ශ්‍රී ලංකා සහල් නිපදවන්නන්ගේ සමූපකාර සංගමයෙන් 2019 ඔක්තෝබර් 31 දිනට ලබා ගත් තොරතුරු අනුව අදාළ ණය යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික් සමිති 8 මගින් සාමාජික මෝල් හිමියන්ට කිලෝ ග්‍රෑම් 17,217,999 ප්‍රමාණයක වී ලබා දී තිබූ අතර, එම වී වලට සාපේක්ෂව සහල් කිලෝ ග්‍රෑම් 10,761,247 ක ප්‍රමාණයක් අදාළ සමිති 8 වෙත ලැබිය යුතු වුවද, සාමාජික මෝල් හිමියන් විසින් සමිති වෙත ලබා දී තිබුණේ සහල් කිලෝ ග්‍රෑම් 9,206,825 ක ප්‍රමාණයක් පමණි. ඒ අනුව සහල් සමිති වලට ලබාදීමේදී කිලෝ ග්‍රෑම් 1,554,425 ක ඌනතාවයක් විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික් සමූපකාර සමිතිය | වී මිලදී ගැනීම් ප්‍රමාණය (කි.ග්‍රෑම්) | ලැබිය යුතු සහල් ප්‍රමාණය (කි.ග්‍රෑම්) | ලද සහල් ප්‍රමාණය (කි.ග්‍රෑම්) | වෙනස (කි.ග්‍රෑම්) | ලද සහල් ප්‍රමාණය ලැබිය යුතු සහල් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|---|
| පොළොන්නරුව | 9,341,091 | 5,838,181 | 5,749,520 | 88,661 | 98 |
| පුත්තලම | 2,751,215 | 1,719,509 | 1,560,755 | 158,755 | 90 |
| අනුරාධපුර | 1,143,551 | 714,719 | 365,925 | 348,794 | 51 |
| මඩකලපුව | 1,009,186 | 630,741 | 530,455 | 100,286 | 84 |
| නුවර | 370,630 | 231,644 | 220,560 | 11,084 | 95 |
| අම්පාර | 566,585 | 354,115 | 311,425 | 42,691 | 87 |
| හම්බන්තොට | 1,362,368 | 851,480 | 233,750 | 617,730 | 27 |
| කුරුණෑගල | 673,373 | 420,858 | 234,435 | 186,423 | 55 |
| **එකතුව** | **17,217,999** | **10,761,247** | **9,206,825** | **1,554,424** | |

මේ අනුව ඒ ඒ දිස්ත්‍රික් සමිතිවල සාමාජික මෝල් හිමියන් විසින් අපේක්ෂිත පරිදි සිය සමිති වෙත සහල් ලබාදිම කර නොමැති බව නිරික්ෂණය වන අතර හම්බන්තොට, කුරුණෑගල සහ අනුරාධපුර වැනි දිස්ත්‍රික් සම්බන්ධයෙන් වූ කල එය වඩාත් අයහපත් විය.

ඉහත 3.6.2.1 ජේදයේ( අ) යටතේ දැක්වෙන ආහාර කොමසාරිස්වරයා විසින් වී මිලදී ගැනීම සහ ඊට අදාළව ලැබිය යුතු සහල් ප්‍රමාණය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද දත්ත සහ එම කරුණටම අදාළව සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සංගමය මගින් ඉදිරිපත් කරන ලද මෙම (ආ) ජේදයෙහි දැක්වෙන තොරතුරු අතර විශාල වශයෙන් වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය.

**(ඇ) සහල් නිෂ්පාදනය සම්බන්ධ සමිති මට්ටමේ නිරීක්ෂණ**

එක් එක් දිස්ත්‍රික් සමිති විසින් වී මිලදී ගැනීම හා සහල් නිෂ්පාදනය කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා සහල් නිපදවන්නන්ගේ සමූපකාර සංගමය මගින් ලබා ගන්නා ලද තොරතුරු පහත පරිදි විය.

**(I) කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්පාදන සමූපකාර සමිතිය**

කුරුණෑගල දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිතියට අයත් සාමාජික මෝල් හිමියන් විසින් විසින් තමන් විසින් නිපදවන ලද සහල් සමිතිය වෙත නියමිත දිනට බාරදිම කළ යුතු වුවත්, එසේ සහල් භාරදීම සඳහා ගත් කාල පමාව දින 21 ක සිට දින 76 දක්වා කාල පරාසයක් තුළ විහිදෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් සහල් මෝල් හිමියන් ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව දිස්ත්‍රික් සමිති විසින් සිදු කරනු ලබන සහල් මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ කටයුතු අධීක්ෂණය දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් කළ යුතුව පවතී. නමුත් අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් මේ තත්ත්වය ඇතිවී තිබූ බව නිරීක්ෂණය විය.

**(II) අම්පාර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමිතිය**

දිස්ත්‍රික් සමිති විසින් මෝල් හිමියන් වෙත ලබාදෙනු ලබන වී සහල් බවට පත් කර නැවත සමිතිය වෙත භාරදීමේදී වී කිලෝ එකකින් අපේක්ෂිත සහල් ප්‍රමාණය නැවත සමිතිය වෙත භාරදීම කළ යුතු වුවද, අම්පාර දිස්ත්‍රික්කයේ ඇතැම් සහල් මෝල් හිමියන් විසින් අපේක්ෂිත සහල් ප්‍රතිශතය ලබා දී නොමැති බව නිරීක්ෂණය විය. එහිදී හාල් මෝල් හිමියන් විසින් ලබා දිය යුතු වූ සහල් ප්‍රතිශතය සියයට 62 ක ප්‍රමාණයක් වුවත්, ඇතැම් හාල් මෝල් හිමියන් විසින් ලබා දී තිබූ සහල් ප්‍රමාණය සියයට 34.6 ක් පමණ අඩු අගයක් ගන්නා බව නිරීක්ෂණය විය.

### 3.5.3 නිෂ්පාදනය කරනු ලබන සහල් අලෙවි කිරීම

### 3.5.3.1 උපරිම සහතික මිල පිළිබඳ කොන්දේසි ඉටු කිරීම

මෙම වැඩසටහන යටතේ රජය මගින් සැපයෙන කාරක ප්‍රාග්ධනය යොදා ගනිමින් සාමාජික මෝල් හිමියන් විසින් වී සහල් කර තම දිස්ත්‍රික් සමිතිය වෙත ලබාදිය යුතු අතර දිස්ත්‍රික් සමිතිය විසින් රජයේ උපරිම සිල්ලර මිල යටතේ අලෙවි කිරීමට කටයුතු කළ යුතු බව දන්වා තිබේ. 2019 නොවැම්බර් 27 දින වන විට ඒ ඒ සමිති විසින් නිෂ්පාදනය කරන ලද සහල් ප්‍රමාණය පිළිබඳ ආහාර කොමසාරිස්වරයාගෙන් හා ශ්‍රී ලංකා සහල් නිපදවන්නන්ගේ සමූපකාර සංගමයෙන් ලබාදුන් දත්තවල වෙනස්කම් පැවතුන අතර, අලෙවි කරන ලද සහල් ප්‍රමාණය පිළිබඳ ලද තොරතුරුවලට අනුව නිෂ්පාදනය කරන ලද සහල් ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳ තොරතුරු පහත දැක්වෙන පරිදි වේ.

| දිස්ත්‍රික් සමිතිය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | වටිනාකම (රු.) |
|---|---:|---:|
| පොලොන්නරුව | 6,741,211 | 535,283,330 |
| අම්පාර | 548,790 | 39,200,317 |
| කුරුණෑගල | 106,095 | 7,908,689 |
| හම්බන්තොට | 237,450 | 15,393,040 |
| මඩකලපුව | 415,670 | 32,145,702 |
| අනුරාධපුර | 298,455 | 22,166,979 |
| පුත්තලම | 3,898,770 | 300,740,507 |
| මහනුවර | 228,399 | 16,563,623 |
| | 12,474,840 | 969,402,187 |

සහල් අලෙවිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 8 මුළු සහල් අලෙවිය කිලෝ ග්‍රෑම් 12,474,840 ක් විය. වැඩසටහන ප්‍රකාරව රජයේ උපරිම සිල්ලර මිල යටතේ සහල් අලෙවි කළ යුතු බව දක්වා තිබුණද දිස්ත්‍රික් සහල් මෝල් හිමියන් එම සහල් අලෙවි කිරීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදය පිළිබඳව වැඩසටහන ආරම්භයේදී ගිවිසුම්වලට එළඹීමේදී වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානයට ලක්වී නොතිබූ බව ගිවිසුම් ප්‍රකාරව නිරීක්ෂණය විය.

**(ආ) සතොස සහ සුපිරි වෙළඳ සැල් හරහා අලෙවි කිරීම**

(i) 2019 නොවැම්බර් 27 දින වන විට සමුපකාර සමිති විසින් නිෂ්පාදනය කරන ලද සහල් ප්‍රමාණය වූ කිලෝ ග්‍රෑම් 12,474,840 ක ප්‍රමාණයකින් 2019 ඔක්තෝබර් 31 දිනට අලෙවි කරන ලද කිලෝ ග්‍රෑම් 3,771,598 ක ප්‍රමාණයක් සතොස ඇතුළු සුපිරි වෙළඳසැල් හා රජයේ සැපයුම්කරුවකු වෙත අලෙවි කර තිබූ අතර, ඉතිරි සහල් ප්‍රමාණය අදාළ සමිති විසින් විවිධ අලෙවි ක්‍රම ඔස්සේ සහල් වෙළඳපළට සන්නම් නාම යටතේ අලෙවි කර තිබුණද එම තොරතුරු සමිති වෙතින් විගණනය සඳහා ලබා ගත නොහැකි විය. විස්තර පහත පරිදි විය.

| ආයතනය | **2019.10.31 දිනට** අලෙවි කළ ප්‍රමාණය කිලෝග්‍රෑම් | වටිනාකම රු. |
|---|---:|---:|
| සතොස ආයතනය | 2,485,240 | 197,939,270 |
| සුපිරි වෙළඳ සැල | 794,380 | 64,003,974 |
| සුපිරි වෙළඳ සැල | 74,960 | 5,996,800 |
| සුපිරි වෙළඳ සැල | 104,393 | 8,201,180 |
| සුපිරි වෙළඳ සැල | 14,250 | 1,099,025 |
| සුපිරි වෙළඳ සැල | 35,500 | 2,866,500 |
| රජයේ සැපයුම්කරුවකු වන (පුද්ගලික) ආයතනය | 262,875 | 20,884,150 |
| | 3,771,598 | 300,990,899 |

(ii) ඉහත තොරතුරු අනුව සතොස ආයතනය වෙත අලෙවි කර තිබූ සහල් ප්‍රමාණය සතොස ආයතනයේ මුළු සහල් අවශ්‍යතාවයෙන් සියයට 21 ක් විය. මේ අනුව පාරිභෝගිකයන්ට රජය විසින් සහතික කළ මිලට සහල් මිලදී ගැනීමේ අවස්ථාව මෙහි දී උදා වී තිබුණි.

(iii) 2019 ඔක්තෝබර් 31 දින වන විට රජයේ සැපයුම්කරුවකු වන පෞද්ගලික ආයතනයක් වෙත රු.20,884,150 ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 262,875 ක ප්‍රමාණයක් ලබා දී තිබේ. එම ආයතනය රජයේ සැපයුම්කරුවකු වන බැවින් සහ ඔහු වෙත නිකුත් කරන ලද සහල් ප්‍රමාණය විවෘත වෙළඳපල වෙත නිකුත් වීමක් සිදු නොවන බැවින් වැඩසටහන තුළින් අපේක්ෂා කරන ලද සහල් වෙළඳපල තුළ තරඟකාරිත්වයක් ඇති කිරීම සහ සහල් මිල ස්ථායී කිරීම යන අරමුණු කරා ළඟා වී නොමැති බව නිරීක්ෂණය විය.

**3.5.3.2 සහල් අලෙවිය සම්බන්ධයෙන් මහනුවර හා පොලොන්නරුව දිස්ත්‍රික් සමිති වලට අදාල නිරීක්ෂණ**

විස්තර පහත දැක්වේ.

**(අ) මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය**

සී/ස මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතියේ සාමාජික මෝල් හිමියන් ලබාදෙන සහල්වල වටිනාකමට චෙක්පතක් ලබාගෙන සහල් අලෙවි කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය කරනු ලැබේ.

(I) 2019 නොවැම්බර් 05 දිනට වටිනාකම රු.2,537,375 ක් වූ චෙක්පත් 19 ක් අත රදවාගෙන තිබූ අතර එයින් රු.1,080,960 ක් වටිනා චෙක්පත් 10 ක් ඉදිරි දින යෙදූ චෙක්පත් වන අතර කල් පිරුණු දින 03 සිට දින 120 දක්වා වූ රු.1,456,415 ක් වටිනා චෙක්පත් 09 ක් ඒ අතර විය.

(II) අදාළ කාල සීමාව තුළ සාමාජිකයන් 13 සඳහා රු.12,555,473 ක් වටිනා සහල් තොග සමිතිය විසින් අලෙවි කර තිබුණි. 2019 නොවැම්බර් 05 දිනට සමාජිකයන් 04 දෙනෙකු විසින් ලබා දී තිබු චෙක්පත් 04 ක් අගරු වී තිබුණි. එහි වටිනාකම රු.412,610 බව නිරීක්ෂණය විය.

(III) මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතියේ සාමාජිකයන්ට සහල් අලෙවි කර ගැනීම සඳහා ක්‍රමවේදයක් නොතිබූ හෙයින් සමිතිය හරහා විකිණීම වෙනුවට සාමාජිකයින් ඔවුන් විසින්ම ණය පදනම මත සහල් අලෙවි කර තිබුණි. ඒ අනුව පාරිභෝගිකයාට

පාලන මිලෙහි වාසිය ලැබුණේද යන්න නිරීක්ෂණය නොවේ. මෙහිදී සමුපකාර සමිතියේ ණය මුදල් අයවීම ප්‍රමාද වීම හේතුවෙන් රජය විසින් ලබාදුන් අරමුදල් කාරක ප්‍රාග්ධනය ලෙස වී මිලදී ගැනීමට නැවත නැවත යොදවා ගත නොහැකි වී තිබුණි. 2019 අප්‍රේල් සිට සැප්තැම්බර් 30 දක්වා කාලසීමාව තුළ මිලදී ගෙන තිබූ සමස්ත වී ප්‍රමාණය කිලෝග්‍රෑම් 356,724 ක් වූ අතර එහි වටිනාකම රු.14,710,976 ක් විය. චක්‍රලේඛය පරිදි දින 03 ක් ඇතුළත සහල් භාරදීමක් නොකර සාමාජිකයා සහල් ළඟ රදවාගෙන අලෙවි කිරීම හා සහල් සඳහා ඉදිරි දින 20 ට වැඩි චෙක්පත් ලබාදීම හා කල්පිරුණු චෙක්පත් දින 120 දක්වා කාලයක් බැංකුගත නොකිරීම නිසා රජය ලබාදුන් කාරක ප්‍රාග්ධනය රු.මිලියන 10 චක්‍රීයව කාර්යක්ෂමව හා ඵලදායීව යොදාගෙන නොතිබුණි.

**(ආ) මහා සංගමයේ සභාපතීත්වය නියෝජනය කරන පොලොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය**

රජය විසින් ලබාදුන් රු. මිලියන 206 ක මුදල භාවිතා කරමින් ගොවීන්ගෙන් වී මිලදීගෙන සමිතියේ සාමාජිකත්වය දරණ සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් හරහා සහල් නිපදවා අලෙවි කර ඇති ආකාරය පිළිබඳව සිදුකල පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. ණය නිදහස් කිරීමේ උපදෙස් චක්‍රලේඛ අනුව හා ගිවිසුම් අනුව සහල් අලෙවි කර ලැබෙන මුදල් වෙනම ගිණුමක තැන්පත් කර ගනුදෙනු කලයුතු අතර, ඒ අනුව පෞද්ගලික බැංකුවක ආරම්භ කල ගිණුමක මෙම මුදල් තැන්පත් කර තිබුණි. උතුරු මැද පළාත් සමුපකාර ප්‍රඥාප්තියට අනුව රජයේ බැංකුවක ගිණුම ආරම්භ කල යුතු වුවත්, පෞද්ගලික බැංකුවක ගිණුම ආරම්භ කර තිබුණි.

ii. පෞද්ගලික බැංකුවක ආරම්භ කර තිබූ අංක 100450004581 දරන ගිණුමෙන් 2019 අප්‍රේල් 01 දින සිට 2019 ඔක්තෝබර් 01 දින දක්වා පහත පරිදි චෙක්පත් 70 ක් මගින් රු. 170,055,000 මුදලක් ඉවත් කරගෙන තිබුණද, ඊට අදාලව ගෙවීම් වවුචර් පිළියෙල කර නොතිබුණු අතර, චෙක්පත් නිකුත් කිරීමට අදාළ කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අතර, එම සියළුම ගනුදෙනු සභාපතිවරයා විසින් සිදුකර ඇති බවත් සාමාන්‍යාධිකාරිවරිය ඒ පිළිබඳ කිසිවක් නොදන්නා බවත්, විගණනයට ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මෙහි අභ්‍යන්තර පාලන ක්‍රම දුර්වලවීම හේතුවෙන් මෙවැනි ගනුදෙනු සිදුවී ඇති බව නිරීක්ෂණය විය. එම චෙක්පත් වලට අදාළ විස්තර පහත පරිදි වේ.

| කාලපරිච්ඡේදය | චෙක්පත් සංඛ්‍යාව | වටිනාකම (රු.) |
|---|---|---|
| 04/04/2019 - 30/04/2019 | 4 | 1,745,000 |
| 02/05/2019 - 31/05/2019 | 11 | 25,025,000 |
| 01/06/2019 - 28/06/2019 | 16 | 18,720,000 |
| 01/07/2019 - 31/07/2019 | 11 | 32,750,000 |
| 01/08/2019 - 31/08/2019 | 6 | 36,400,000 |
| 01/09/2019 - 30/09/2019 | 10 | 29,100,000 |
| 01/10/2019 - 31/10/2019 | 125 | 26,315,000 |
| එකතුව | 183 | 170,055,000 |

තවද, මේ පිළිබඳව භෞතිකව පරීක්ෂා කල අවස්ථාවේ රු. 100,000 ක වටිනාකමැති අංක 516630 දරණ චෙක්පත කළමනාකරු, සණස සංවර්ධන බැංකුව නමින් ලියා තිබූ අතර ඒ සඳහා කිසිදු ලියවිල්ලක් හෝ ගෙවීම් වවුචරයක් නොතිබුණි.

iii. සමුපකාර සමිතියේ ගනුදෙනු සියල්ල පරිගණක ගත Quick book මෘදුකාංගය භාවිතා කර සිදුකර තිබූ අතර මෙහි සියළු කටයුතු සභාපතිවරයා විසින් සිදුකර තිබුණි.

iv. බැංකු ගනුදෙනු සඳහා මහජන බැංකුවේ හා පෞද්ගලික බැංකුවක ජංගම ගිණුම් දෙකකින්ද සණස සංවර්ධන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක්ද ලෙස ගිණුම් තුනක් මගින් සිදුකර තිබූ අතර මේ සඳහා මුදල් පොත් නඩත්තු කර නොතිබුණි.

v. 2019 සැප්තැම්බර් 30 දිනට බැංකු ගිණුම් තුනෙහි පහත පරිදි රු. 239,267 ක ශේෂයක් පමණක් පැවතුණි.

| | |
|---|---|
| මහජන බැංකු ගිණුම | (රු. 605,048) |
| පෞද්ගලික බැංකුවක ජංගම ගිණුම | රු. 385,566 |
| සණස සංවර්ධන බැංකු ගිණුම | රු. 458,749 |

vi. 2019 දෙසැම්බර් 06 දිනට දිනට සමුපකාරය විසින් අලෙවි කර තිබූ සහල්වලින් රු. මිලියන 112 ක මුදලක් අයවිය යුතු බවට නිරීක්ෂණය වූ අතර, ණයට අලෙවි කිරීමේදී අදාළ ගනුදෙනුකරුවන් සමග ලිඛිත ගිවිසුම්වලට එළඹීමට හෝ ණය මුදලට සාධාරණ වන පරිදි ඇප තැන්පතු තබාගැනීමකින් තොරව මෙම ගනුදෙනු සිදුකර ඇති බවද නිරීක්ෂණය විය.

vii. සීමාසහිත පොළොන්නරුව දිස්ත්‍රික් සමූපකාර සමිතිය පුද්ගලික සමාගම් 4 ක් සමග සිදුකළ ණයට විකුණුම් සීමා සහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමය හරහා සිදුකර තිබූ අතර, එම ගනුදෙනුකරුවන්ගේ ණයගැති ශේෂයේ අසමානතාවයන් විගණනයේදී නිරීක්ෂණය විය. පොළොන්නරුව දිස්ත්‍රික් සමූපකාර සමිතියේ ණයගැති ලේඛනය අනුව 2019 දෙසැම්බර් 06 දිනට අදාළ සමාගම් 4 න් සමිතියට අයවිය යුතු මුදල රු. 57,245,677.00 වූ අතර එම දිනට ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමයේ ණයගැති ලේඛනය අනුව එම ගණුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු මුදල රු. 3,851,065.00 මුදලක් විය. ඒ අනුව රු. 53,394,612.00 ක මුදලක් ශේෂ නොගැලපීම් ලෙස විගණනයේදී නිරීක්ෂණය වූ අතර වෙනස සඳහා හේතු විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී. විස්තර පහත පරිදි වේ.

| ගණුදෙනුකරු | සී/ස පොළොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතියේ ණයගැති ලේඛනය අනුව ශේෂය | සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමයේ ණයගැති ලේඛනය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i) සුපිරි වෙළඳසැල | 8,295,420 | 984,165 | 7,311,255 |
| (ii) සුපිරි වෙළඳසැල | 5,996,400 | 400 | 5,996,000 |
| (iii) සුපිරි වෙළඳසැල | 3,200,000 | 2,866,500 | 333,500 |
| (iv) සුපිරි වෙළඳසැල | 39,753,857 | _ | 39,753,857 |
| **එකතුව** | **57,245,677** | **3,851,065** | **53,394,612** |

viii. බැංකු ප්‍රකාශය අනුව රු. 18,077,488 ක් වටිනා චෙක්පත් අහරු වී තිබූ අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට මාස 05 ක කාලය ඉකුත්වූ රු.60,000 ක් වටිනා අහරු චෙක්පත් 01 ක්ද මාස 1 සිට 05 දක්වා කාලය සඳහා වූ රු.18,077,488 ක් වටිනා චෙක්පත් 45 ක්ද ඒ අතර විය. මෙම චෙක්පත් විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අතර, සමූපකාරයේ සාමාන්‍යාධිකාරිවරිය එම චෙක්පත් සභාපතිවරයාගේ භාරයේ ඇති බවට ප්‍රකාශ කරන ලදී.

ix. සියළුම චෙක්පත් ගනුදෙනු සභාපතිවරයා විසින් සිදුකර තිබුණු අතර, හිස් චෙක්පත් භාණ්ඩාගාරිකගෙන් අත්සන් ලබාගෙන සභාපතිවරයාගේ අභිමතය පරිදි සිදුකර තිබුණි. පරීක්ෂා කල දිනට පහත පරිදි හිස් චෙක්පත් 09 ක් අත්සන් කර තිබුණි.

- පෞද්ගලික බැංකුවේ අංක 100450004581 දරණ ජංගම ගිණුමේ සභාපති හා භාණ්ඩාගාරික යන දෙදෙනාම අත්සන් කළ හිස් චෙක්පත් 04 ක් තිබුණි.
- රාජ්‍ය බැංකුවේ අංක 005-/-001-4-0091283 දරණ ජංගම ගිණුමේ භාණ්ඩාගාරික හා සභාපති දෙදෙනාම අත්සන් කර තිබු චෙක්පත් 01 ක් හා භාණ්ඩාගාරික පමණක් අත්සන් කර තිබුණු චෙක්පත් 05 ක් තිබුණි. මෙලෙස හිස් චෙක්පත් අත්සන් කිරීම මූල්‍ය පාලනය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය කෙරෙනු ලැබේ.

x. ගෙවීම් ගනුදෙනු පරිගණකයට ඇතුලත් කිරීම, ගෙවීම් කිරීම, බැංකු සැසඳුම් පරිගණකයෙන් ලබාගැනීම ආදිය සියළු කටයුතු සභාපතිවරයා විසින් සිදුකර තිබු අතර, ගිණුම්කරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය ඉතාමත් දුර්වල වීම මත අක්‍රමිකතාවයන් සිදුවීමට ඉඩකඩ පැවතුණි.

### 3.5.3.3 වෙළඳපොලේ සහල්වල උපරිම සිල්ලර මිල

(අ) සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ඉතා ඉක්මනින් ණය සහන ලබාදීමේ වැඩසටහනෙහි එක් ප්‍රධාන අරමුණක් වන්නේ සහල් වෙළඳපල තුල මිල ස්ථායීතාවයක් ඇතිකර එමඟින් පාරිභෝගිකයාට සහන සැලසීම වේ. මෙම තත්ත්වය උදාකරලීම සඳහා රජය විසින් 2019 මැයි 31 දිනැති හා අංක 2125/66 දරන ගැසට්පත්‍රය මඟින් 2019 මැයි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ආකාරයට සහල් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කර තිබුණි.

| සහල් වර්ගය | කිලෝ ග්‍රෑම් එකක උපරිම සිල්ලර මිල<br>රු. |
|---|---|
| සුදු සම්බා - වාෂ්පයෙන් තැම්බූ /තම්බන ලද -දේශීය (කීරි සම්බා හා සුදුරු සම්බා) | 85 |
| සුදු නාඩු - තම්බන ලද /වාෂ්පයෙන් තැම්බූ - දේශීය (මොට්ටයිකරුපන් හා ආට්ටකාරී හැර) | 80 |
| රතු නාඩු - තම්බන ලද /වාෂ්පයෙන් තැම්බූ - දේශීය (මොට්ටයිකරුපන් හා ආට්ටකාරී හැර) | 74 |

(ආ) ඒ අනුව කිසිම පුද්ගලයෙකු බෙදාහරින්නකු හෝ වෙළෙන්දෙකු විසින් ඉහත දක්වා ඇති සහල් වර්ග සඳහන් කොට ඇති උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මිලකට වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුව තිබේ. එසේ වුවත් සතොස ආයතනය හා සුපිරි වෙළඳසැල් හරහා කරන ලද අලෙවි කිරීම් හැරුණු විට විවෘත වෙළඳපොලෙහි දක්වා ඇති මිල ගණන් වලට වැඩියෙන් අදාළ සහල් වර්ග අලෙවි වන බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

i. 2019.05.31 දින සිට 2019.11.30 දක්වා වූ කාල පරාසය තුළ 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වගන්තිය යටතේ දිස්ත්‍රික්ක 21 ක උපරිම මිළ සීමාව ඉක්මවා සහල් අලෙවිකල සහල් අලෙවි සැල් 457 ක් වැටලීම් කර රු.1,882,500 ක දඩ මුදලක් අයකරගෙන තිබුණි.

ii. එම දිස්ත්‍රික්ක 21 න් දිස්ත්‍රික්ක 5 ක අවම වැටලීම් ප්‍රමාණයක් සිදුකර තිබූ අතර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ තොරතුරු වලට අනුව 2019 ජූනි සිට 2019 නොවැම්බර් දක්වා එම ප්‍රදේශවල වෙළඳපොලේ සහල් මිල උක්ත ගැසට් පත්‍රයේ පාලන මිල ඉක්මවා අධි මිල රු.1.19 සිට රු.19.25 දක්වා පරාසයක වෙළඳපොලේ අලෙවිකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | සිදුකල වැටලීම් ප්‍රමාණය | සහල් වර්ගය | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | මිල වෙනස රු. | මිල වෙනස රු. | මිල වෙනස රු. | මිල වෙනස රු. | මිල වෙනස රු. | මිල වෙනස රු. |
| පොලොන්නරු | 01 | සම්බා | 12.31 | 10.50 | - | 11.35 | 13.45 | 14.65 |
| | | නාඩු | 9.81 | 9.70 | - | 14.40 | 12.70 | 19.25 |
| කළුතර | 03 | සම්බා | - | 2.33 | 3.00 | 6.47 | 10.25 | 11.00 |
| | | නාඩු | - | 4.00 | - | - | 10.00 | 10.00 |
| අනුරාධපුරය | 04 | සම්බා | 4.91 | 1.65 | 1.19 | 2.60 | 9.67 | 11.00 |
| | | නාඩු | 4.96 | 5.07 | 5.17 | 7.25 | 11.58 | 16.00 |
| කුරුණෑගල | 05 | සම්බා | 3.88 | 2.85 | 5.00 | - | 8.33 | 9.63 |
| | | නාඩු | 4.60 | 3.00 | 5.00 | - | 11.00 | 14.17 |
| මහනුවර | 07 | සම්බා | 6.70 | 2.60 | 2.95 | 4.96 | - | 12.60 |
| | | නාඩු | 4.50 | 3.88 | 7.75 | 9.84 | - | 17.00 |

ඒ අනුව රටතුල රජය විසින් සහල් සඳහා නියම කල පාලන මිල ක්‍රියාත්මක වී නොතිබුණ බවත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රමාණවත් වැටලීම් සිදුකර නොතිබීම හා සහල් වෙළඳපොල සඳහා රජය විසින් සිදුකරන මැදිහත්වීම් ප්‍රමාණාත්මක නොවන බවත් නිරීක්ෂණය කරනු ලැබේ.

### 3.5.3.4 කෙටුම් කුලී ගෙවීම

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2019.03.20 දින නිකුත් කළ අංක 4/3/11-4 දරන සුළු හා මධ්‍ය පරිමාණ හාල් මෝල් හිමියන් වෙත ණය සහන ලබා දීමට අදාල ක්‍රමවේදය පිළිබඳ මාර්ගෝපදේශ (3) iv පරිදි මෝල් හිමියන් වෙත ලබාදෙන වී සහල් බවට පරිවර්ථනය කිරීම සඳහා සී/ස සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය හා මෝල් හිමියා අතර වූ ගිවිසුම ප්‍රකාරව කෙටුම් කුලියෙන් කොටසක් මෝල් හිමියා විසින් බැංකු

මගින් ලබාගෙන තිබෙන ණය වෙනුවෙන් ගෙවිය යුතු මාසික බැංකු වාරිකය අදාල බැංකුවට ගෙවිය යුතු අතර ඉතිරි කොටස මෝල් හිමියාට ගෙවිය යුතුය.

විගණනය වෙත ලද තොරතුරු ප්‍රකාරව මෝල් හිමියා විසින් ගෙවිය යුතු බැංකු ණය සම්බන්ධයෙන් මෙම කෙටුම් කුලිය උපයෝගී කරගෙන තිබෙන ආකාරය පහත දැක්වේ.

| සමිතියේ නම | වැඩසටහන සඳහා ණය ලබාදුන් සාමාජික සංඛ්‍යාව | ලබාදුන් ණය මුදල (රු.මි) | ලබා ගත් වීවල වටිනාකම | ණය වාරික ගෙවූ සාමාජික සංඛ්‍යාව | ගෙවූ ණය වාරික වල වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 13 | 9 | 19,383,375 | 09 | 388,457 |
| හම්බන්තොට දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 15 | 38 | 52,063,656 | තොරතුරු ලැබී නොමැත | තොරතුරු ලැබී නොමැත - |
| කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 19 | 16 | 28,554,134 | 08 | 992,312 |
| අම්පාර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 13 | 16 | 20,488,719 | තොරතුරු ලැබී නොමැත | තොරතුරු ලැබී නොමැත |
| මඩකලපුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 12 | 25 | 31,728,488 | 05 | 1,226,157 |
| පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 30 | 64 | 113,412,976 | 30 | 5,686,635 |
| අනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 25 | 59 | 38,801,389 | 21 | 2,247,595 |
| පොලොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය | 62 | 206 | 387,140,964 | තොරතුරු ලැබී නොමැත | තොරතුරු ලැබී නොමැත |

ඉහත තොරතුරු අනුව 2019 අප්‍රේල් සිට නොවැම්බර් 30 දක්වා කාල සීමාව තුල මෙම වැඩසටහන හා සම්බන්ධ සී/ස දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති 05 ක සාමාජිකයන් 73 දෙනෙකු වෙනුවෙන් රු. 10,541,156 ක මුදලක් බැංකු ණය වාරික ලෙස ගෙවා තිබුණි.

දිස්ත්‍රික් සමිති මට්ටමින් කරන ලද නිරීක්ෂණ පහත පරිදි වේ.

**(අ) අම්පාර දිස්ත්‍රික්කය**

ගිවිසුම් ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය විසින් සාමාජික මෝල් හිමියන්ට කොටන වී ප්‍රමාණය පදනම් කරගෙන කෙටුම් කුළිය ගෙවිය යුතු වුවද, 2019 නොවැම්බර් 06 දින වන විට කොටන ලද වී කිලෝග්‍රෑම් 553,085 ට අදාළව කෙටුම් කුළිය වන රු. 1,106,170 ක මුදලක් අදාළ මෝල් හිමියන්ට ගෙවා නොතිබුණි.

**(ආ) පොලොන්නරුව දිස්ත්‍රික්කය**

මෝල් හිමියන් වෙනුවෙන් මිලදීගන්නා වී සහල් කොට නියම කර ඇති ප්‍රතිශතයට අනුව සහල් සමූපකාර සමිතියට භාරදිය යුතු අතර, ඒ සඳහා මෝල් හිමියන්ට කෙටුම් කුලියක් ගෙවීම සඳහා අමාත්‍යාංශ මාර්ගෝපදේශයට අනුව සිදුකල යුතු වුවත්, මෙම සමිතියේ විගණිත දිනය වූ 2019 ඔක්තෝබර් 01 දිනට වී කිලෝ 8,819,766 ක් සඳහා කිලෝ එකකට රු.6 බැගින් මෝල් හිමියන්ට ගෙවිය යුතු කෙටුම් කුලි රු. 52,918,596 ක් ගෙවීම පැහැර හැර තිබුණි.

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් නඟා සිටුවීමේ ක්‍රියාවලියේදී මෙම තත්ත්වයන් සතුටුදායක නොවන බව නිරීක්ෂණය විය.

**3.5.3.5 වැඩසටහන මගින් සහල් මෝල් හිමියන්ගේ බැංකුවල හිඟහිටි ණය ශේෂයන් පියවීමට උපකාරීවීම**

සුළු හා මධ්‍ය පරිමාණ හාල්මෝල් හිමියන්ට ඉතා ඉක්මනින් ණය සහන ලබාදීම පිළිබඳව ඉදිරිපත් කළ සන්දේශ අංක PS/NC-04/CP/41/2019 හි අංක 03 යටතේ දක්වා ඇති පරිදි සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට නව ක්‍රමවේදයක් හරහා යලි වෙළඳපොළට ප්‍රවේශ වීමට (සැළකිය යුතු ප්‍රමාණයකින්) පහසුකම් සැපයීම පිණිස ඔවුන් මගින් වී මිලදී ගැනීමට කුඩා හා මධ්‍යය පරිමාන සමූපකාර සමිති වෙත අරමුදල් සැපයීමටත් එමගින් ලැබෙන කාරක ප්‍රාග්ධනය යොදාගෙන සුළු හා මධ්‍යය පරිමාණ මෝල් හිමියන් විසින් වී සහල් කර ලබන ඉපයුම් හරහා ණය සඳහා නැවත ගෙවීමටත් යෝජනා කර ඇත.

නමුත් මෙම වැඩසටහනට සම්බන්ධ වූ සහල් මෝල් හිමියන්ගේ බැංකුණය හිඟ වූ වටිනාකම හා වැඩසටහන යටතේ බැංකු ගිණුම් වලට (වී සහල් කර ලබන ඉපයුම් හරහා)

තැන්පත් කළ මුදල් ප්‍රමාණය පිළිබඳව සලකා බැලීමේදී ඇතැම් සහල් මෝල් හිමිකරුවන් සම්බන්ධව මෙම අරමුණ ඉටු නොවී ඇති බව නිරීක්ෂණය විය.

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ 2019 අප්‍රේල් මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා වූ කාල පරිච්ඡේදය තුල වී මෝල් හිමියන් විසින් ගෙවිය යුතු ණය වාරික ප්‍රමාණයෙන් 97% එනම් ගෙවිය යුතු සාමාන්‍ය ණය වාරික ප්‍රමාණය වන රු. 11,737,362 න් රු.11,348,906 ක් ගෙවීමට නොහැකි වී තිබුණි. ඒ අනුව උක්ත වැඩසටහන මහනුවර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) තවද සී/ස මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ වී මිලදී ගැනීමේ ලේඛනවලට අනුව වී මෝල් හිමියන් 03 දෙනෙකු විසින් වී කිලෝ 23,754 ක් රු. 1,008,651 මුදලකට මිලදී ගෙන තිබුණත් කිසිදු ණය වාරිකයක් පියවීමට අසමත් වී තිබුණි. ඒ අනුව මිලදී ගත් වී ප්‍රමාණයෙන් ලද කෙටුම් කුලිය ගිවිසුම් ප්‍රකාරව ණය මුදල පියවීමට භාවිතා කර නොතිබුණි.

## 3.6 සම්බන්ධිත ආයතන මගින් ඉටු කරන කාර්යයන්

### 3.6.1 ආහාර කොමසාරිස්වරයා විසින් නඩත්තු කරනු ලබන දත්ත පද්ධතිය

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය සහන ලබාදීම සඳහා වූ වැඩසටහන ප්‍රකාරව සියළුම සහල් නිෂ්පාදන සමුපකාර සමිති හා සහල් මෝල් හිමියන් අධීක්ෂණය කිරීමට පරිගණක වැඩසටහනක් සකස් කළ යුතුව පැවතුනි. දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති ලේකම්වරුන් සහ වී අලෙවි මණ්ඩලය සමග සිදුකරන ගනුදෙනු මෙන්ම මෝල් හිමියන්ගේ වී මිලදී ගැනීම් ක්‍රියාවලියද ඇතුලත් වන පරිදි මෙම වැඩසටහනට අදාළව සිදු කරන ගනුදෙනු සහ ප්‍රගතිය අධීක්ෂණය මෙම පරිගණක වැඩසටහන තුළින් අපේක්ෂා කර තිබුණු අතර එම දත්ත පද්ධතිය පවත්වාගෙන යාම හා දත්ත පද්ධතියේ පූර්ණ අධීක්ෂණය ආහාර කොමසාරිස්වරයා සතු වේ.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ආහාර කොමසාරිස් වරයා විසින් නඩත්තු කරනු ලබන දත්ත පද්ධතිය වෙතින් හා සීමාසහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමය වෙතින් සමස්ත වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව ලබාගන්නා ලද තොරතුරු පහත පරිදි විය.

**i. වී මිලදී ගැනීම් ක්‍රියාවලියට අදාල විස්තර පහත පරිදි විය.**

| දිස්ත්‍රික් සමූපකාර සමිතිය | ආහාර දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව - වී මිලදී ගැනීම් | | සීමා සහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමයේ තොරතුරු අනුව - වී මිලදී ගැනීම් | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය (kg) | වටිනාකම (රු.) | ප්‍රමාණය (kg) | වටිනාකම (රු.) |
| පොළොන්නරුව | 8,788,591 | 387,140,964 | 9,341,091 | 413,043,335 |
| අම්පාර | 499,946 | 20,488,719 | 566,585 | 22,775,586 |
| කුරුණෑගල | 685,223 | 28,554,134 | 673,373 | 28,056,434 |
| හම්බන්තොට | 1,327,624 | 52,063,656 | 1,362,368 | 53,420,621 |
| මඩකලපුව | 758,396 | 31,728,488 | 1,009,186 | 42,216,097 |
| අනුරාධපුර | 952,273 | 38,801,389 | 1,143,551 | 46,622,112 |
| පුත්තලම | 2,615,955 | 113,412,976 | 2,751,215 | 119,581,988 |
| මහනුවර | 471,110 | 19,383,375 | 370,630 | 15,643,745 |
| **එකතුව** | **16,099,118** | **691,573,701** | **17,217,999** | **741,359,918** |

ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු අනුව මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික් සමිති 8 මගින් මිලදී ගෙන තිබූ වී ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 16,099,118 හා එහි වටිනාකම රු. 691,573,701 ක් වේ. එසේ වුවත් සීමා සහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමයෙන් ලබා ගත් තොරතුරු අනුව දිස්ත්‍රික් සමිති 8 මගින් මිලදී ගෙන තිබූ වී ප්‍රමාණය කිලෝග්‍රෑම් 17,217,999 හා එහි වටිනාකම රු. 741,359,918 ක් වේ. ඒ අනුව ආහාර දෙපාර්තමේන්තුවේ තොරතුරු හා අදාළ සංගමයේ තොරතුරු අනුව වී මිලදී ගැනීමේදී කිලෝ ග්‍රෑම් 1,118,881 හා වටිනාකම රු. 49,786,217 ක වෙනසක් නිරීක්ෂණය විය.

ii. සමස්ත වැඩසටහන යටතේ සිදුකර තිබූ සහල් අලෙවිය සම්බන්ධ තොරතුරු පහත පරිදි විය.

| දිස්ත්‍රික් සමුපකාර සමිතිය | ආහාර දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව | | සීමා සහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමයේ තොරතුරු අනුව | |
|---|---|---|---|---|
| | සහල් අලෙවිය | | සහල් අලෙවිය | |
| | ප්‍රමාණය (කි.ග්‍රෑ) | වටිනාකම (රු.) | ප්‍රමාණය (කි.ග්‍රෑ) | වටිනාකම (රු.) |
| පොළොන්නරුව | 6,741,211 | 535,283,331 | 5,759,520 | 454,239,060 |
| අම්පාර | 548,790 | 39,200,318 | 1,569,590 | 121,991,132 |
| කුරුණෑගල | 106,095 | 7,908,690 | 361,275 | 26,796,092 |
| හම්බන්තොට | 237,450 | 15,393,040 | 530,455 | 40,802,075 |
| මඩකලපුව | 415,670 | 32,145,703 | 229,850 | 16,722,353 |
| අනුරාධපුර | 298,455 | 22,166,980 | 297,760 | 21,218,310 |
| පුත්තලම | 3,898,770 | 300,740,507 | 252,800 | 16,481,440 |
| මහනුවර | 228,399 | 16,563,624 | 220,830 | 16,407,155 |
| **එකතුව** | **12,474,840** | **969,402,193** | **9,222,080** | **714,657,617** |

ආහාර දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව මෙම වැඩසටහන යටතේ සම්පූර්ණයෙන් අලෙවි කරන ලද සහල් ප්‍රමාණය කි.ග්‍රෑම් 12,474,840 වන අතර වටිනාකම රු.969,402,193 ක් වේ. එසේ වුවත් සීමා සහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමයෙන් ලබා ගත් තොරතුරු අනුව සහල් අලෙවිය කි.ග්‍රෑම් 9,222,080 ක් වන අතර එහි වටිනාකම රු.714,657,617 ක් විය. ඒ අනුව සහල් අලෙවිය සම්බන්ධයෙන් ඉහත ආයතන දෙක වෙතින් ලබා ගන්නා ලද තොරතුරු ප්‍රකාරව ප්‍රමාණය සම්බන්ධයෙන් කි.ග්‍රෑම් 3,252,760 ක වෙනසක් ද වටිනාකම සම්බන්ධයෙන් රු. 254,744,576 ක වෙනසක්ද නිරීක්ෂණය විය. මෙම තත්ත්වය වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනයට මෙන්ම නිවැරදි තීරණ ගැනීම සඳහාද දැඩිව බලපාන කරුණක් වේ.

(ආ) එසේම සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සංගමය විසින් අදාළ දත්ත ආහාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමේදී එකම දත්තය වැඩිවාර ගණනක් යෙදීම, කාණ්ඩ අංක සඳහා තොග (Stock) ලෙස සඳහන්වීම එක් සහල් වර්ගයක් සඳහා එක් නාමයක් භාවිතා නොකිරීම, සාමාජික සමිතිවල කේතයන් වැරදි ලෙස සටහන් කොට එවීමට වැනි විවිධ දෝෂයන් සහිතව ඉදිරිපත් කිරීමටද කටයුතු කර තිබුණි.

(ඇ) ආහාර කොමසාරිස්වරයා විසින් පරිගණක පද්ධතිය සම්බන්ධ අධීක්ෂණ කටයුතු සිදු කිරීමෙන් අනතුරුව පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී පවතින අක්‍රමිකතාවයන් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කඩිනමින් අදාළ පාර්ශවයන් වෙත වාර්තා කළ යුතු අතර සමස්ත වැඩසටහනේ ප්‍රගතිය මෙහෙයුම් කමිටුව වෙත වාර්තා කළ යුතු වේ. එසේ වුවත් සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතිය විසින් සිය දිස්ත්‍රික් සමිතිවල කටයුතුවලට අදාළ තොරතුරු නියමිත පරිදි ආහාර කොමසාරිස්වරයා වෙත එවීමට කටයුතු නොකිරීම අදාළ ප්‍රගති සමාලෝචන කටයුතුවලට බාධාවක්ව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට ඉක්මනින් ණය සහන ලබාදීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා, දිස්ත්රික් සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ දිස්ත්‍රික් සහල් මෝල් හිමියන්ගේ සමිති අතර ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව අදාළ අධීක්ෂණ කටයුතු සඳහා නිසි තොරතුරු සැපයීමට දිස්ත්‍රික් සහල් මෝල් හිමියන් බැඳී සිටී. එසේ වුවත් ඉහත පරිදි විධිමත්ව තොරතුරු නොසැපයීම තුළින් සහල් මෝල් හිමියන් ගිවිසුමට අනුකූලව කටයුතු කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

### 3.6.2 සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය

සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය 1972 අංක 5 දරන සමූපකාර පනත යටතේ ලියාපදිංචි සමූපකාර සමිතියක් වන අතර සමූ/60 අංකය යටතේ 2018.08.08 දින ලියාපදිංචි වී තිබේ. මෙහි අධ්‍යක්ෂ මණ්ඩලය 09 දෙනෙකුගෙන් සමන්විත වන අතර ආරම්භයේදී සමූපකාර කොමසාරිස්වරයා විසින් පත් කරන ලද නිලධාරියෙකුගෙන් සහ ඒ ඒ දිස්ත්‍රික්ක සමිති 08 හි නියෝජිතයෙකු බැගින් සමන්විත වී තිබේ. සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ණය සහන සැලසීමේ වැඩසටහන හා සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) **අදාළ මාර්ගෝපදේශය අනුව කටයුතු කිරීම.**

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය සහන ලබාදීමට අදාළව කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන , වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව ඉහත සමිතිය විසින් ඉටු කළ යුතු කාර්යභාරය ලෙස ලෙස දක්වා තිබෙන්නේ ආහාර කොමසාරිස් මගින් සකස් කරන ලද පරිගණක වැඩසටහනට අවශ්‍ය කරන ලද දත්තයන් සැපයීම විය.

එසේ වුවත් මෙම සීමාසහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය විසින් සිය දිස්ත්‍රික් සාමාජිකයන් සමඟ වෙන්ව ඇතිකරගත් ගිවිසුමක් යටතේ කටයුතු කරනු ලබන අතර මේ සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සම්බන්ධව නිකුත් කරන ලද මාර්ගෝපදේශ වල කිසිඳු සඳහනක් නොවේ. එසේම දිස්ත්‍රික් ලේකම්වරයා, සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ දිස්ත්‍රික් සහල් මෝල් සමිති අතර ඇති කරගන්නා ලද ගිවිසුම තුළ ඒ පිළිබඳව සඳහනක් නොවේ. සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සමග ඉහත සමිතිය ඇතිකරගත් ගිවිසුම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. 2019 මහ කන්නයේ වී තොග මිලට ගෙන සහල් බවට පත්කර වෙළඳපලට නිකුත් කිරීම සම්බන්ධයෙන් 2019.03.23 දින සිට 2019.10.20 දින කාලය දක්වා බලපවත්වන සේ පාර්ශවයන් විසින් ගිවිසුම් ගත වී තිබුණි.

ii. සහල් වල මිල තීරණය කිරීමේදී දෙවන පාර්ශවය ඇතුළු සියලුම සාමාජික සමිති විසින් නිෂ්පාදනය කරනු ලබන සහල් නිෂ්පාදනයන්හි මිල තීරණය කිරීමේදී පූර්ණ බලය පළමු පාර්ශවය (මහා සංගමය) වෙත හිමි අතර පළමු පාර්ශවය විසින් නියම කරන ලද මිල ගණන් යටතේ පමණක් සහල් අලෙවි කළ යුතු බව දක්වා තිබුණි.

iii. **සංගමය විසින් රඳවා ගත් මුදල්**

සීමාසහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය සහ දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති අතර ඇතිකරගත් ගිවිසුමේ 30 වන වගන්තිය ප්‍රකාරව රජය මගින් 2019 මහ කන්නයේදී ඉහත කී ව්‍යාපෘතිය වෙනුවෙන් පොලී රහිතව ප්‍රාග්ධනය සපයා දෙන අතර දෙවන පාර්ශවය විසින් ලබා ගන්නා එකී ප්‍රාග්ධන මුදල වෙනුවෙන් වාර්ෂිකව සියයට දහයක සේවා ගාස්තුවක් පළමු පාර්ශවයට ගෙවීමට දෙවන පාර්ශවය මෙකී ගිවිසුමෙන් පොරොන්දුවට බැඳී ගිවිස ගනී යනුවෙන් සඳහන් කර තිබුණි.

මේ අනුව සමුපකාර සංගමයේ සාමාජිකත්වය ලබාගෙන තිබු සමුපකාර අට අතුරින් සමිති 2 ක් එකී වර්ෂයට සියයට දහයක පොලී අනුපාතය පදනම් කරගෙන එක් මාසයක් සඳහා වන පොළිය ලෙස රු. 458,333 ක් සීමාසහිත සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය වෙත ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| සමිතියේ නම | ගාස්තු ගෙවූ දිනය | ගණනය කිරීම | ගෙවූ මුදල රු. |
|---|---|---|---|
| i. සී/ස පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය | 2019.06.12 | 20,000,000 x 10/100 x 1/12 | 166,687 |
| ii. සී/ස අනුරාධපුරය දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය | 2019.07.03 | 35,000,000x10/100x 1/12 | 291,666 |
| | | | 458,353 |

එසේ වුවද 2019 ඔක්තෝබර් 28 දින සිට ක්‍රියාත්මක වන දෙවන ගිවිසුමේ 31 වගන්තිය මඟින් මාසිකව රු.100,000 ක ගාස්තුවක් ගෙවීමට දෙපාර්ශවය එකඟ වී තිබූ බව නිරීක්ෂණය විය.

**(ඇ) ගෙවීම් සහ අනෙකුත් මුදල් ගනුදෙනු**

2019 නොවැම්බර් මස 29 දින සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමයේ සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2019 නොවැම්බර් 30 අවස්ථා 25 කදී දිනට රු.51,026,288 වටිනාකමකින් යුත් ගෙවීම් සඳහා ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. (ඇමුණුම 1)

(ii) සංගමය විසින් පිළියෙල කරනු ලබන ගෙවීම් වවුචර් සඳහා අනුක්‍රමික අංක පිළිවෙලට අංක යොදා නොතිබුණි.

(iii) 2019 නොවැම්බර් 30 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.1,298,325 බැර ශේෂයක් පැවති අතර බැංකුවට තැන්පත් වූ නමුත් හඳුනා ගත නොහැකි මුදල් තැන්පත් වලින් එය සමන්විත විය.

(iv) 2019 අප්‍රේල් 09 දින රු.80,000 ක මුදල් ලැබීම්වලට අදාලව කුවිතාන්සි සංගමය නිකුත් කර ඇතත් සංගමයේ බැංකු ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

(v) රු.2,370,265 ක මුදල් තැන්පතු සංගමයේ බැංකු ගිණුමට ඇතුලත් කර තිබුණත් ඊට අදාල මුදල් ලැබීම් කුවිතාන්සිය විගණනයට ඉදිරිපත් නොවුණි.

**(ඈ) සීමාසහිත /ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතියේ කළමනාකාරිත්ව කටයුතු**

i. පොලොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතියේ සභාපති ලෙස කටයුතු කරන තැනැත්තා සමස්ථ ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ සභාපතිවරයා ලෙසද කටයුතු කරන අතර, පොළොන්නරුව දිස්ත්‍රික් සමුපකාර සමිතියේ ලේකම් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස තනතුරු දරන අයම සමස්ථ ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ පිළිවෙලින් ලේකම් හා භාණ්ඩාගාරික ලෙස කටයුතු කරයි. මේ අනුව පොලොන්නරුව දිස්ත්‍රික් සමුපකාර සමිතියේ සභාපති, ලේකම් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස තනතුරු දරන තිදෙනා සමස්ථ ලංකා සහල් නිෂ්පාදන සමුපකාර සමිතියේ ප්‍රධාන තනතුරු තුනම දරමින් මෙම සමිති දෙකම පාලනය සිදුකර තිබුණි.

ii. පොළොන්නරු දිස්ත්‍රික් සමුපකාර සමිතියේ සභාපතිවරයා විසින් දිස්ත්‍රික් ලේකම්ගෙන් ණය මුදල් නිදහස් කරගත් පසු පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර සමුපකාර කොමසාරිස්වරයාගේ හා දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් වලට පරිබාහිරව තම අභිමතය පරිදි කටයුතු කර ඇති බවට නිරීක්ෂණය විය.

iii. මෙම සමිතියේ සභාපතිවරයා අතුරු ව්‍යවස්ථාව හා සමුපකාර නීතිය හා පොදු නීතිය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බවට අනාවරණය වූ බැවින්, සමුපකාර සමිති ප්‍රඥාප්තියට අනුව පරීක්ෂණයන් සිදුකිරීමට උතුරුමැද පළාත් සමුපකාර කොමසාරිස්වරයා විසින් කටයුතු කර තිබුණි.

**(ඉ) ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාරව සහල් නොසැපයීම හේතුවෙන් දඩ මුදල් අය කිරීම**

දිස්ත්‍රික් සමුපකාර සමිති 08 මගින් නිෂ්පාදනය කරන සහල් ලංකා සතොස සමාගම වෙත සපයනු ලබන්නේ සීමාසහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය(මහා සංගමය)මගිනි. මෙලෙස සංගමය විසින් සහල් අළෙවි කිරීමේදී එකඟ වූ කොන්දේසි ප්‍රකාරව ලංකා සතොස සමාගමට සහල් ලබා නොදීම නිසා රු. 3,517,502 ක මුදලක් දඩ ලෙස අයකර තිබුණි. මෙලෙස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය දිස්ත්‍රික් සමුපකාර සමිතිය සමග නිසි සම්බන්ධතාවයකින් තොරව සතොස සමාගමේ ප්‍රසම්පාදන කටයුතු සඳහා ඉදිරිපත් වීම නිසා රු. 3,517,502 ක පාඩුවක් දිස්ත්‍රික් සමිති 08 ට සිදුකර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| ටෙන්ඩර් අංකය | සපයනු ලබන ආයතනය | මුදල<br>රු. |
|---|---|---|
| Q/PRO/P/19/020 | ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය | 918,524 |
| Q/PRO/P/19/021 | ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය | 2,154,685 |
| Q/PRO/P/19/026 | ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය | 257,871 |
| Q/PRO/P/19/036 | ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය | 101,858 |
| Q/PRO/P/19/039 | ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය | 84,564 |
| එකතුව | | **3,517,502** |

### 3.6.3 විධිමත් ගිවිසුම්වලට එළඹ කටයුතු කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ණය සහන ලබාදීමට අදාළ ක්‍රමවේදය පිලිබඳ මාර්ගෝපදේශය (2) vii අනුව සී/ස සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය හා සාමාජිකයන් අතර නෛතික ගිවිසුමක් සකස් කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාර්ගෝපදේශයේ (3) iv පරිදි කෙටුම් කුලියෙන් කොටසක් මෝල් හිමියන් විසින් බැංකුවෙන් ලබාගත් ණය වෙනුවෙන් අදාළ බැංකුවට ගෙවිය යුතු අතර ඉතිරි කොටස මෝල් හිමියාට ගෙවිය යුතු බව සඳහන් කර තිබුණද, සී/ස සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති විසින් සිය සාමාජිකයින් සමග ඇතිකරගත් ගිවිසුම් වලදී අදාල බැංකු වාරික ගෙවීම සහ ඉතිරි මුදල් සාමාජිකයාට ගෙවීම් පිලිබඳ කොන්දේසි ඇතුළත්ව නොතිබුණි.

(ආ) කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරි මාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ණය සහන සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ලබාදීමට අදාළ ක්‍රමවේදය පිළිබඳ මාර්ගෝපදේශ 2 (vii) පරිදි සී/ස සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති හා සාමාජිකයන් අතර, නෛතික ගිවිසුම අත්සන් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

(I) මෙම ගිවිසුමේ සඳහන් පරිදි පළමු පාර්ශවය විසින් මෝල් හිමියා වෙත වී ලබා දුන් දින සිට දින තුනක් ඇතුළත කැකුළු හාල්ද දින 05 ක් ඇතුළත තැම්බූ සහල්ද භාරදීම සිදු කළ යුතුය. එහෙත් සාමාජිකයන් සමිතිය වෙත භාරදෙන සහල් තොග ඉතා ඉක්මනින් අලෙවි කර ගැනීම සඳහා ක්‍රමවේදයන් දිස්ත්‍රික් සහල් නිෂ්පාදන සිමිති විසින් සකස් කරගෙන නොතිබුණි.

(II) ඉහත අංක (I) පරිදි සහල් භාරදිය යුතු බවට ගිවිසුමේ සඳහන් කළ සීමාව තුළ සාමාජිකයන් සහල් භාරදී නොතිබූ අතර, එසේ සහල් භාරදිම සිදු කලේ නම් වී සහල් බවට පත්කර මාසයකදී 6 වතාවක් සමිතියට සහල් ලැබේ. එම සහල් අලෙවි කර ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කර තිබුණි නම් සමිති වෙත ලබා දුන් කාරක ප්‍රාග්ධනය උපරිම කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට හැකියාව තිබුණි. එහෙත් එවැනි ක්‍රමවේදයක් නොතිබීම නිසා කාරක ප්‍රාග්ධනය ලෙස ලබා දී තිබූ මුදල් භාවිතා වී තිබූ වාර ගණන අවම බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| සමිතියේ නම | ලබා දුන් කාරක ප්‍රාග්ධන මුදල | මිලදී ගත් වී ප්‍රමාණය | මිලදී ගත් වී වටිනාකම | ලබා දුන් මුදල භාවිතා කළ වාර ගණන |
|---|---|---|---|---|
| ---------------- | --------------- | --------------- | ---------------- | --------------- |
| | රු. | කි.ග්‍රෑම් | රු. | |
| මහනුවර සමිතිය | 10,000,000 | 471,110 | 19,383,374 | 1.93 |
| අනුරාධපුර සමිතිය | 59,870,000 | 952,273 | 38,801,388 | 0.64 |
| පොලොන්නරුව සමිතිය | 206,000,000 | 8,788,591 | 387,140,964 | 1.87 |
| හම්බන්තොට සමිතිය | 38,000,000 | 1,327,624 | 52,063,655 | 1.37 |
| අම්පාර සමිතිය | 16,000,000 | 499,946 | 20,488,719 | 1.28 |
| මඩකලපුව සමිතිය | 25,000,000 | 758,396 | 31,728,487 | 1.26 |
| කුරුණෑගල සමිතිය | 16,000,000 | 685,223 | 28,554,134 | 1.78 |
| පුත්තලම | 64,000,000 | 2,615,955 | 113,412,975 | 1.77 |

(III) සී/ස සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය විසින් ලංකා සතොස ලිමිටඩ් ආයතනයට ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව සහල් අලෙවි කිරීමේ කටයුතු සිදු කර තිබූ අතර, එකඟ වූ පරිදි නියමිත කාලසීමාව තුල සහල් තොග නියමිත ලබාගැනීමට හා සහල් අලෙවි කර ගැනීමට ක්‍රමවේදයන් සකස් කර දීමට අපොහොසත් වී තිබුණි.

### 3.6.4 වී අලෙවි මණ්ඩල ගබඩා උපයෝජනය

(අ) සුළු හා මධ්‍ය පරිමාණ හාල්මෝල් හිමියන්ට ඉතා ඉක්මනින් ණය සහන සැලසීම සම්බන්ධව එවකට ගරු ජනාධිපතිවරයා විසින් 2019 පෙබරවාරි 11 දින ඉදිරිපත් කල සංදේශ අංක PS/NC-4/CP/41/2019 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව රටෙහි වාර්ෂික සහල් අවශ්‍යතාවය මෙ.ටො. මිලියන 2.4 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති බවත් එය ආසන්න වශයෙන් වී මෙ.ටො. මිලියන 3.6 ක් බවත් දක්වා ඇත. ඒ අනුව 2018 වසරේ සහල් නිෂ්පාදනය අඩු වීම තුල මිල ඉහළ යාම පාලනය කිරීමේ අරමුණද ඇතිව මෙම වැඩසටහන ආරම්භ කර තිබුණි.

(ආ) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 3 වගන්තියේ සඳහන් පරිදි වී සහ සහල් මිලදී ගැනීම, විකිණීම, සැපයීම සහ බෙදා හැරීම, සිදු කළ යුතුය. එසේම ඔවුන්ගේ සේවාවන් යටතේ ආහාර සුරක්ෂිතතාවය උදෙසා ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාම, පාරිභෝගිකයාට සාධාරණ මිලක් යටතේ තත්ත්වයෙන් උසස් ධාන්‍ය සැපයීම සඳහා වැඩපිළිවෙලක් යෙදීම, ගොවීන්ට වී සඳහා සහතික මිලක් ලබාදීම තුළින් ඔවුන්ගේ ජීවනෝපාය උසස් කිරීමට කටයුතු කිරීම ආදිය

කළ යුතු විය. මෙම අරමුණු සඳහා ගමන් කිරීමේදී වී අලෙවි මණ්ඩලය විසින් 2018/2019 මහ කන්නයේ කෙසේ කටයුතු කර ඇත්දැයි පරීක්ෂා කිරීමේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

(ඇ) වී අලෙවි මණ්ඩලය යටතේ එක් එක් ප්‍රදේශවල පවතින ගබඩා ධාරිතාවය හා 2018/19 මහ කන්නයේ වී වලින් මිලට ගත් ප්‍රමාණය පහත දැක්වේ.

| කලාපය | ගබඩා සංඛ්‍යාව | ධාරිතාවය | මිලට ගත් වී ප්‍රමාණය | ධාරිතාවයෙන් මිලට ගත් ප්‍රතිශතය | මෙම වැඩසටහන සඳහා සහල් අවශ්‍යතාවය | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| -------- | ----------- | --------------- | ----------------- | -------------- | -------------- | ------------- |
| | | මෙට්‍රික් ටොන් | මෙට්‍රික් ටොන් | (%) | මෙට්‍රික් ටොන් | (%) |
| නැගෙනහිර | 37 | 23,505 | 3,923 | 17 | 3583 | 91 |
| උතුර | 39 | 25,200 | 11,643 | 46 | 797 | 7 |
| පොලොන්නරුව | 36 | 41,460 | 1,489 | 4 | 1489 | 100 |
| අනුරාධපුරය | 74 | 77,125 | 7,399 | 10 | 7200 | 97 |
| අම්පාර | 65 | 75,020 | 11,635 | 16 | 835 | 7 |
| වයඹ | 27 | 36,020 | 1,724 | 5 | 1723 | 99 |
| දකුණ | 37 | 39,550 | 10,456 | 26 | 5083 | 48 |
| | 315 | 317,880 | 48,269 | | 20,710 | |

ඉහත තොරතුරු අනුව වී අලෙවි මණ්ඩලයේ ගබඩා ධාරිතාවය මෙට්‍රික් ටොන් 317,880 කි. 2018/2019 මහ කන්නයේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් 3,072,572 ක් වේ. ඒ අනුව වී අළෙවි මණ්ඩලයට සමස්ථ අස්වැන්නෙන් මිලට ගත හැකි ප්‍රමාණය සියයට 10 ක් පමණ විය. නමුත් මිලට ගෙන තිබුණේ මෙට්‍රික් ටොන් 48,269 කි. එනම් සියයට 1.6 ක් තරම් වූ ප්‍රමාණයක් විය. මෙසේ මිලට ගත් ප්‍රමාණයෙන් මෙම සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නඟා සිටුවීමේ වැඩසටහන සඳහා වූ සහල් අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 20,710 කි. එනම් වී අලෙවි මණ්ඩලය මිලදී ගත් ප්‍රමාණයෙන් සියයට 43 කි. මේ අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

i. රටේ සමස්ථ වී අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය මිලදී ගෙන තිබුණේ සියයට 2 කටත් වඩා අඩු ප්‍රමාණයක් බැවින් වී ගොවීන් සඳහා සාධාරණ මිලක් යටතේ මිලදී ගැනීම් ප්‍රමාණය ඉතාම අවම මට්ටමක පැවති බව.

ii. රට තුල ආරක්ෂාකාරී වී තොගයක් හෝ සහල් තොගයක් පවත්වා නොගැනීම නිසා උපද්‍රවයකදී මහජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය අවදානමකට ලක් වී ඇති බව.

### 3.7 වැඩසටහනේ සමස්ත කාර්යසාධනය

### 3.7.1 සහල් සඳහා පාරිභෝගික වියදම

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ පසුගිය දත්ත අනුව ලංකාවේ ගෘහ ඒකකය ආහාර සඳහා වන සාමාන්‍ය මාසික වියදමින් වැඩිම ප්‍රතිශතයක් දරන්නේ සහල් සඳහා බව ගම්‍ය වේ. විස්තර පහත දැක්වේ.

**සාමාන්‍ය මාසික වියදම ප්‍රතිශතයක් ලෙස**

| **ආහාර වියදම** | **2002** | **2005** | **2006/7** | **2009/10** | **2012/13** | **2016** |
|---|---|---|---|---|---|---|
| සහල් | 18.0 | 13.8 | 13.9 | 17.3 | 13.6 | 12.8 |
| තිරිඟු පිටි | 1.2 | 1.2 | 1.1 | 1.4 | 1.3 | 1.0 |
| පාන් | 4.3 | 3.6 | 3.5 | 3.2 | 3.0 | 2.4 |
| කුළුබඩු | 9.1 | 9.0 | 9.3 | 9.1 | 9.0 | 9.8 |
| මාෂ බෝග | 3.2 | 3.4 | 3.5 | 4.1 | 3.5 | 3.6 |
| එළවළු | 7.9 | 8.1 | 8.4 | 7.6 | 8.2 | 8.0 |
| පොල් | 7.3 | 5.6 | 5.5 | 5.6 | 6.1 | 5.7 |
| මස් | 3.2 | 4.4 | 4.2 | 3.9 | 4.3 | 4.8 |
| මාළු | 6.3 | 8.5 | 8.6 | 8.8 | 9.1 | 9.5 |
| කරවල | 3.7 | 3.8 | 4.0 | 3.7 | 4.2 | 4.0 |
| කිරි හා කිරි නිෂ්පාදන | 8.4 | 9.9 | 8.7 | 7.8 | 8.9 | 8.2 |
| බිත්තර | 0.8 | 1.0 | 1.0 | 1.0 | 1.0 | 1.1 |
| පලතුරු | 3.6 | 3.9 | 3.4 | 2.9 | 2.9 | 3.2 |
| සීනි | 3.3 | 3.3 | 3.6 | 3.4 | 2.9 | 2.2 |
| අනෙකුත් ආහාර හා පාන වර්ග | 19.6 | 20.3 | 21.2 | 20.1 | 21.8 | 23.6 |
| **එකතුව** | **100** | **100** | **100** | **100** | **100** | **100** |

මේ අනුව මිලියන 21 ක් පමණ වන ශ්‍රී ලාංකික ජනගහනයේ ප්‍රධාන ආහාරය වන හා මාසික සාමාන්‍ය වියදමෙන් සියයට 13 ක් පමණ වන අධික වියදම දරන්නේ සහල් පරිභෝජනය උදෙසා වේ.

ඒ අනුව ගොවීන් වෙත සාධාරණ මිලක් ලබා දීම හා සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නඟා සිටුවීම මගින් ඔවුනට අයත් වෙළඳපල කොටස් වැඩි කිරීම හා එමඟින් පාරිභෝගිකයින් වෙත සාධාරණ මිලක් ලබා ගැනීමට හැකිවන පරිදි මෙම යාන්ත්‍රණය ශක්තිමත් කිරීම කළ හැකි වේ.

අදාල වැඩසටහන ක්‍රියාත්මක වීමේ දී ගැටළු සහගත තත්ත්වයන් පැන නැඟී තිබුණද, වැඩසටහන් මනා ලෙස අධීක්ෂණයට ලක් නොවීම නිසා අපේක්ෂිත අරමුණු පූර්ණ වශයෙන් ලඟා කර ගත නොහැකි වී තිබුණි.

### 3.7.2 සහල් මිල පාලනය සඳහා දායක වීම

මෙම වැඩසටහන සඳහා 2019.12.31 දින විට රජය විසින් රු.මිලියන 434.87ක් අවස්ථා කිහිපයකදී මුදල් නිදහස් කර තිබුණි. එම මුදල උපයෝජනය කර 2018/19 මහ කන්නයේ සමස්ත වී අස්වැන්න වන මෙට්‍රික් ටොන් 3,072,581 කින් දිස්ත්‍රික් සමිති 8 කින් මෙට්‍රික් ටොන් 16099.11 ක් එනම් සියයට 0.52 ක් මිලට ගෙන තිබුණි. එසේ මිලට ගත් වී ප්‍රමාණයෙන් වෙළඳ පොල අවශ්‍යතාවයෙන් සපයන ලද සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 10558.42 කි. මෙම ප්‍රමාණය හා සමගාමීව ජීවන වියදම් අනුකමිටුව විසින් 2019 අප්‍රේල් 01 දින සිට රු. 85 ක් ලෙස සහල් සඳහා උපරිම මිලක් තීරණය කිරීමත් පාරිභෝගික සේවා අධිකාරිය විසින් පාලන මිලට වඩා වැඩි මිලට සහල් අලෙවි කරන්නන් පිළිබඳ වැටලීම් කිරීමත් සමඟ දේශීය වෙළඳපොලේ සහල් මිල රු.100 ට වඩා අඩු වන ලෙස කෙටි කලකට පමණක් පහල බැස තිබුණි.

| | | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 2017 | 97 | 96 | 94 | 96 | 97 | 98 | 98 | 102 | 102 | 105 | 106 | 109 |
| | 2018 | 111 | 110 | 110 | 113 | 114 | 113 | 113 | 111 | 112 | 114 | 115 | 115 |
| | 2019 | 108 | 107 | 105 | 101 | **96** | 95 | 91 | 90 | 93 | 98 | 100 | 105 |
| මහනුවර | 2017 | 99 | 91 | 89 | 91 | 94 | 98 | 99 | 99 | 103 | 104 | 104 | 108 |
| | 2018 | 111 | 111 | 111 | 112 | 111 | 112 | 115 | 115 | 115 | 111 | 110 | 112 |
| | 2019 | 111 | 109 | 107 | 108 | **105** | 100 | 92 | 93 | 93 | 96 | 99 | 100 |
| මාතර | 2017 | 109 | 106 | 105 | 99 | 103 | 104 | 102 | 106 | 104 | 106 | 104 | 105 |
| | 2018 | 107 | 100 | 103 | 110 | 115 | 118 | 107 | 108 | 120 | 118 | 122 | 120 |
| | 2019 | - | - | 107 | - | **99** | - | 90 | 97 | 91 | 92 | 97 | 100 |
| අනුරාධපුර | 2017 | 97 | 90 | 92 | 91 | 93 | 98 | 99 | 98 | 102 | 104 | 107 | 108 |
| | 2018 | 108 | 109 | 109 | 108 | 109 | 110 | 108 | 110 | 111 | 109 | 112 | 114 |
| | 2019 | 110 | 110 | 109 | 97 | **94** | 93 | 94 | 93 | 93 | 95 | 99 | 100 |

### 3.7.3 වැඩසටහන මගින් සහල් මිලට වූ බලපෑම

#### 3.7.3.1 සහල් මිලේ හැසිරීම පිළිබඳ 2019 මහ බැංකු වාර්තා දත්ත

(අ) 2019 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ දත්ත අනුව 2009 වර්ෂයේ සිට 2013 දක්වා වසර 05 ක කාල සීමාව තුළ සම්බා සහල්වල මිල වැඩිවීම 2009 වර්ෂයට 2010 වර්ෂයේදී සියයට 0.52 කින් වැඩි වී තිබුණද, අනෙකුත් වර්ෂවල මිල අඩු වී තිබුණි. එහෙත් 2014 වර්ෂයේ සිට 2018 දක්වා වසර 05 ක කාලසීමාව තුළ සම්බා සහල් මිල අඛණ්ඩව ඉහළ ගොස් තිබූ අතර, එය 2018 වර්ෂයේදී රු. 112.67 දක්වා උපරිමයකට පැමිණ තිබුණි. 2014 වර්ෂයේදී වාර්තා වී තිබූ රු. 83.83 ක මිලට සාපේක්ෂව 2018 වර්ෂයේ මිල වැඩිවීම සියයට 34.40 ක් විය.

(ආ) තවද ඉහත මහ බැංකු වාර්තා දත්ත අනුව කැකුළු හාල් කිලෝග්රෑම් එකක මිල 2009 දී රු. 61.65 ක් වුවද, 2013 දක්වා කාල සීමාව තුළ වාර්තා වූ උපරිම මිල රු. 58.33 ක් විය. ඒ අනුව 2009 ට සාපේක්ෂව කැකුළු සහල් මිල අඩුවීමක් පෙන්නුම් කළද, 2014 වර්ෂයේ වාර්තා වූ රු. 71.92 ක් වූ සහල් කිලෝවක මිල 2017 වර්ෂයේදී රු. 86 ලෙස වාර්තා වී තිබුණි. එය 2014 වර්ෂයේ මිලට සාපේක්ෂව සියයට 19.57 ක මිල වැඩිවීමක් විය.

(ඇ) තැම්බූ සහල් සඳහා 2009 වර්ෂයේ සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑම් එකකට රු. 63.24 ක් වූ මිල 2012 දක්වා අඛණ්ඩව අඩු වී තිබුණද, 2013 වර්ෂයේ සිට 2017 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

#### 3.7.3.2 සහල් මිල සම්බන්ධ කාලීන ප්‍රවණතා

(අ) හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය විසින් 2017 වර්ෂයේ සිට 2019 දක්වා කාලසීමාව තුළ සහල් මිල පිළිබඳ රැස්කර තිබූ දත්ත අනුව කොළඹ, මහනුවර, මාතර, අනුරාධපුර යන දිස්ත්‍රික්ක 04 හි සම්බා සහල් මිල 2017 අගෝස්තු මාස සිට 2019 අප්‍රේල් දක්වා කාලසීමාව තුළ රු. 102 ත් 115 ත් අතර, පරාසයක පැවතුණි. එහෙත් 2019 වර්ෂයේ මෙම වැඩසටහන ක්‍රියාත්මකවීම ආරම්භ කළ කල මැයි මාසයේ සිට සම්බා සහල් මිල රු. 100 ට වඩා අඩු මිලක් වාර්තා වී තිබූ අතර, අවමය රු. 90 දක්වා පහළ ගොස් තිබූ අවස්ථා ද නිරීක්ෂණය විය.

(ආ) හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් රැස් කළ සහල් මිල පිළිබඳ දත්ත අනුව 2019 වර්ෂයේ අප්‍රේල් මාසය දක්වා ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන නගර 18 ක සහල් මිල සලකා බැලීමේදී රු. 97-116 ත් අතර, පරාසයක පැවතුනද 2019 මැයි මාසයේ සිට එය රු. 105 ට අඩු මිලක් දක්වා පහළ අගයක් වාර්තා වී තිබුණු අතර, අවම මිල ලෙස රු. 90 වාර්තා වී තිබුණි. ඉතා ඉහළ මිලක් පැවති සහල් වෙළඳපොළ තුළ රජය විසින් පැන වූ උපරිම මිල සීමාවට යටත්ව දිස්ත්‍රික් සමූපකාර සමිති විසින් සහල් අලෙවි සඳහා ඉදිරිපත් කිරීම තුළ සහල් මිල යම් අඩුවීමක් සිදු වි ඇති බව නිරීක්ෂණය වේ.

| | ප්‍රදේශය | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | කොළඹ | 108 | 107 | 105 | 101 | **96** | 95 | 91 | 90 | 93 | 98 | 100 | 105 |
| 2. | ගම්පහ | 108 | 109 | 109 | 97 | **93** | | | | 92 | 95 | 97 | - |
| 3. | මහනුවර | 111 | 109 | 107 | 108 | **105** | 100 | 92 | 93 | 93 | 96 | 99 | 100 |
| 4. | දෙහිඅත්තකණ්ඩිය | 108 | 108 | 108 | 86 | 106 | 96 | 92 | 93 | 93 | 95 | 97 | - |
| 5. | හඟුරන්කෙත | 110 | 110 | 110 | | | | 95 | 98 | 94 | 96 | 98 | - |
| 6. | කුරුණෑගල | 110 | 110 | 110 | 98 | **95** | 95 | 94 | 93 | | 94 | 96 | - |
| 7. | යාපනය | 116 | 116 | | 100 | **95** | 96 | 88 | | | | 98 | - |
| 8. | අනුරාධපුර | 110 | 110 | 109 | 97 | **94** | 95 | 94 | 93 | 93 | 95 | 99 | 100 |
| 9. | හම්බන්තොට | 112 | 112 | 108 | 97 | **95** | 94 | 93 | 93 | 92 | 99 | 101 | - |
| 10. | රත්නපුර | 110 | 107 | 111 | 97 | **95** | 93 | 89 | 96 | 94 | 96 | 99 | - |
| 11. | බදුල්ල | 108 | 109 | 106 | 98 | 99 | 95 | 91 | | | | - | - |
| 12. | ගාල්ල | 110 | 109 | 108 | 111 | **99** | 95 | 95 | 92 | 91 | 94 | - | - |
| 13. | අම්පාර | 109 | 105 | 104 | 109 | **98** | 96 | 95 | | | | - | - |
| 14. | දඹුල්ල | 109 | 109 | 107 | 97 | **93** | 94 | 92 | 91 | 92 | | - | - |
| 15. | මඩකලපුව | 117 | 116 | 105 | 105 | **103** | 99 | | | | | - | -- |
| 16. | කෑගල්ල | 113 | 112 | 109 | 107 | **97** | 95 | 92 | 91 | 92 | | - | - |
| 17. | ඇඹිලිපිටිය | 106 | 106 | 102 | 101 | **101** | 99 | 93 | 94 | 96 | - | - | - |
| 18. | තිස්සමහාරාමය | 113 | 112 | 107 | 111 | **100** | 97 | 95 | - | - | - | - | - |

### 3.7.4 සහල් වෙළඳ පොලේ තරඟකාරීත්වය

ශ්‍රී ලංකාවේ සහල් වෙළඳ පොළ ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකු අතර පාලනය වන බව හඳුනාගෙන තිබුණි. ඒ නිසා මෙම වැඩසටහනේ එක් අරමුණක් වූයේ පාරිභෝගිකයාට රජයේ උපරිම සිල්ලර මිලට යටත්ව සහල් මිලට ගැනීමට අවස්ථාවක් සලසාදීමයි. ඒ අනුව මෙම වැඩසටහන යටතේ නිෂ්පාදනය කරනු ලබන සහල් ලංකා සතොස හා තවත් සුපිරි වෙළඳසැල් 4 කට අලෙවි කර තිබුණි. එසේම පාරිභෝගික අධිකාරිය විසින් සහල් සඳහා පනවා තිබූ උපරිම සිල්ලර මිල ඉක්මවා සහල් අලෙවි කිරීම වෙළඳපොළ තුල බහුලව දක්නට ලැබුණද, මෙම වැඩසටහන යටතේ පනවා තිබූ උපරිම සිල්ලර මිලට යටත්ව රු. 103,051,629 වටිනා සහල් කිලෝ 1,286,358 ප්‍රධාන සුපිරි වෙළඳසැල් 05 ක අලෙවිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 3.7.5 වී මිලට ගැනීමට රජය මැදිහත් වීම

මෙම වැඩසටහනේ ආරම්භක අදියරේදී වී (සම්බා) කිලෝ එකක් රු.41 බැගින් ගොවීන්ගෙන් මිලට ගන්නා ලෙස උපදෙස් ලැබී තිබුණි. වී මිලදී ගැනීමේදී මහා පරිමාණ මෝල් හිමියන් සහතික මිලට වඩා වැඩි මිලකට ගොවියන්ගෙන් වී මිලට ගැනීම නිසා දිස්ත්‍රික් සමිතිවලට සහල් නිපදවීම සඳහා වී මිලට ගැනීමට නොහැකි විය. මේ හේතුව මත රජය මැදිහත් වී දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ පැවති වී අලෙවි මණ්ඩල ගබඩාවලින් වී කිලෝවක් රු.48 බැගින් මිලට ගැනීමට අවස්ථාව සලසා දෙන ලදි.

රජය විසින් වී ගොවිතැන් නගා සිටුවීම සඳහා ගොවීන්ට අවශ්‍ය බිත්තර වී ලබාදීම, වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබාදීම සහ වගා කටයුතු සඳහා අවශ්‍ය පොහොර සහනාධාර ලබාදීම, ණය ලබාදීම සඳහා විශාල වියදමක් දරයි. එමෙන්ම ගොවීන් විසින් නිෂ්පාදනය කරනු ලබන වී සහතික මිලක් යටතේ මිලදී ගැනීමටද කටයුතු කරනු ලබයි. එබැවින් මෙම සහනය ගොවියාට මෙන්ම පාරිභෝගිකයා වෙතද යා යුතුවේ.

රජය විසින් 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා (ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව) පොහොර සඳහා රු.මිලියන 9795 සිට 39787 ක පරාසයක වියදමක්ද, රක්ෂණ වන්දි සඳහා රු.මිලියන 5.1 සිට රු.මිලියන 184.6 ක පරාසයක වියදමක් ද දරා තිබූ අතර, එකී කාල පරිච්ඡේදය වෙනුවෙන් වී වගාව සඳහා ණය සහන වශයෙන් රු. මිලියන 1918 සිට රු.මිලියන 6,879 ක් දක්වා පරාසයක් තුල රජය වියදම් ලෙස දරා තිබුණමුත් රජය මගින් එවැනි දායකත්වයක් ලබා දෙමින් වී නිෂ්පාදනය ඉහල නැංවීමට කටයුතු කළද, වී අස්වැන්න මහා පරිමාණ මෝල් හිමියන් කිහිපදෙනෙක් විසින් පාලනය කිරීම තුලින් ගොවියා, පාරිභෝගිකයා හා සහල් නිෂ්පාදකයා යන අංශ තුනට සාධාරණ වෙළඳපොලක් අහිමි වී ඇත.ඒ නිසා සහල් වෙළඳපොල පාලනය කිරීමට ඉහත වියදම් දැරීමට අමතරව, ඉහත පාර්ශවයන්ගේ උන්නතිය වෙනුවෙන් සහල් වෙළඳපොල කළමණාකරනය කිරීමේ යාන්ත්‍රණයක් ඇතිකිරීම සඳහා රජය මැදිහත් වීමේ අවශ්‍යතාවය මෙහිදී කැපී පෙනුණි.

| වර්ෂය | පොහොර ප්‍රමාණය | පොහොර සඳහා වියදම | වී වගාව සඳහා ලබාදී ඇති ණය | රක්ෂණ වන්දි ගෙවීම |
|---|---|---|---|---|
| | මෙ.ටො.දහස් | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2009 | 423 | 23,117.92 | 1,918 | 15.4 |
| 2010 | 490 | 20,277.69 | 2,541 | 15.3 |
| 2011 | 453 | 37,444.33 | 4,418 | 184.6 |
| 2012 | 412 | 31,942.85 | 5,527 | 78.3 |
| 2013 | 363 | 9,795.54 | 5,427 | 136.2 |
| 2014 | 272 | 15,170.75 | 4,762 | 55.2 |
| 2015 | 341 | 39,787.65 | 5,582 | 154.7 |
| 2016 | 202 | 10,934.61 | 6,384 | 67.7 |
| 2017 | - | 16,463.03 | 5,562 | 8.8 |
| 2018 | 111 | - | 6,879 | 5.1 |

### 3.7.6 සහල් අලෙවිය තුලින් ලද දායකත්වය

මෙම වැඩ සටහන යටතේ ආයතන කීපයකට සහල් අලෙවි කර ඇත. ලංකා සතොස ආයතනය ඉන් එකකි. එහි මාසික සහල් අවශ්‍යතාවයෙන් සියයට 21 ක ප්‍රමාණයක් මෙම වැඩසටහන යටතේ සපයා ඇත.

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සහතික මිලට වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මිලදී ගනු ලබන වී ප්‍රමාණය ඉහළ නංවා සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නගා සිටුවීමේ වැඩසටහනේ පරිදි සුළු හා මධ්‍ය පරිමාණ වි මෝල් හිමියන් මගින් එම සහල් වෙළඳපොලට නිකුත් කිරීමට කටයුතු කිරීම මගින් වෙළඳපොල තුළ සැපයුම්කරුවන් ප්‍රමාණය වැඩිකිරීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නගා සිටුවීම, උපරිම සිල්ලර මිලට යටත්ව සහල් අලෙවි කිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීම පහසු වන බව නිරීක්ෂණය විය.

### 3.7.7 වැඩසටහනේ වර්තමාන තත්ත්වය

(අ) 2020 වර්ෂයේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 300 ක මුදලක් ලබා දීමට කැබිනට් අනුමැතිය හිමි වී තිබූ අතර මෙම මුදලින් 2020 සැප්තැම්බර් 14 දින වන විට පලාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්වරුන් විසින් අදාල සමිති වෙත ලබාදීම සඳහා රු.මිලියන 107 ක් ලබා දී ඇති බව (සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේ ස.සං.දෙ/ව්‍යා/01/OS/(I) අංක දරන හා 2020 සැප්තැම්බර් 18 දිනැති ලිපිය) නිරීක්ෂණය විය.

(ආ) මෙම වැඩසටහන මගින් සහල් මිල පාලනය, සහල් වෙළඳපලේ තරඟකාරිත්වයක් ඇතිකිරීම හා සුළු හා මධ්‍ය පරිමාණ සහල්මෝල් හිමියන් නඟා සිටුවීම යන මූලික අරමුණු ළඟා කර ගැනීමේ කාර්යයන් සඳහා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ සැලකිය යුතු දායකත්වයක් සපයා තිබුණි. එසේම මෙම විගණන වාර්තාවේ පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම තුළින් වැඩසටහන ස්ථාපිත කිරීමේදී අපේක්ෂා කරන ලද අරමුණු කරා ගමන් කිරීමේ හැකියාවක් ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද 2020 වර්ෂයේදී වැඩසටහන සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව 1/3 ක ප්‍රමාණයකට අඩු වී තිබූ අතර වැඩසටහන ඉදිරි වර්ෂ වලදී ඉදිරියට ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් මෙතෙක් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැති නිසා සහල් සඳහා පාලන මිළක් පවත්වාගැනීමේ අපේක්ෂාවෙන් මෙන්ම වැඩසටහන මගින් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු ළඟා කර ගැනීම පිණිස නිසි වැඩපිළිවෙලක අවශ්‍යතාවය මෙහිදී කැපී පෙනේ.

## 04. නිර්දේශ

### 4.1 සාමාජිකයන් තෝරා ගැනීම හා ණය මුදල් ලබා දීම

(අ) සහල් මෝල් හිමියන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය තීරණය කිරීමේදී කාරක ප්‍රාග්ධනය යන්නට ඇතුලත් කරනු ලබන අයිතමයන් මොනවාද යන්න (මුදල්, තොගය, ණය ගැතියන් සහ ණය හිමියන්) තීරණය කිරීම.

(ආ) වැඩසටහනට අදාළ ඉලක්ක ගත කණ්ඩායම තෝරා ගැනීමේදී ඔවුන්ගේ සහල් මෝල් වල ධාරිතාවය, ණය ගැති භාවය, තොග ගබඩා කර ගැනීමේ හැකියාව යනාදී සාධක ඇගයීමකින් හා නිවැරදිතාවය තහවුරු කරගැනීමෙන් පසු සුදුසු කණ්ඩායම තෝරා ගැනීම හා ඔවුන් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.

(ඇ) පළමු අදියරේදී ලබාදුන් ණය චක්‍රීය අරමුදලක් ලෙස භාවිතා කරමින් වී සහල් බවට පත් කිරීමේ කාර්යය කාර්යක්ෂමව ඉටු කළ හා පෙර ලබාදුන් මුදල් නැවත පියවීමට කටයුතු කළ සාමාජිකයන් සඳහා පමණක් අනෙකුත් අදියරයන්හිදී ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කිරීම හා එමගින් වැඩසටහන මගින් ලබාදෙන ණය මුදල් වල අවධානම අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

### 4.2 ණය මුදල් නැවත පියවීම

(අ) කාරක ප්‍රාග්ධනය නැවත අයකරගැනීමට ගතවන කාලය තීරණය කිරීමේදී කර්මාන්තයට අදාල සම්මතයන් (Industrial norms) අනුව කාරක ප්‍රාග්ධන චක්‍රය (Working Capital Cycle) ගණනය කර එම කාල සීමාව තුල ණය අයකරගැනීමට කටයුතු කිරීම.

(ආ) දිස්ත්‍රික් සමිති සඳහා ලබාදෙන ණය මුදල් ගිවිසුම් කාලය අවසානයේදී නැවත පියවීමට කටයුතු නොකරන මෝල් හිමියන් සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

## 4.3 වී මිලදී ගැනීම

(අ) අස්වනු නෙලන කාලයේදීම වී මිලදී ගැනීම සඳහා අදාල මුදල් කල් වේලා ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් සමිති වෙත නිකුත් කිරීමට කටයුතු කිරීම.

(ආ) අස්වනු නෙලන කාලයේදී වී අලෙවි මණ්ඩල ගබඩා වල ඇති තොග හිස් කර ධාරිතාව උපරිම ප්‍රයෝජන වන පරිදි වී මිලදී ගැනීමටත් ඒවා සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ලබා දීමටත් දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් කටයුතු කිරීම හා නවීන තාක්ෂණය අනුව ආරක්ෂිතව වී ගබඩා කළ හැකි ගුදම් පහසුකම් (Silos) ගොඩනැගීම මගින් හා වී වියලන යන්ත්‍ර මිළදී ගැනීම මගින් අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රමාණවත් පරිදි සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්හට වී මිලට ගැනීමට හැකිවන පරිදි කටයුතු පිළියෙල කිරීම.

(ඇ) ගොවීන්ගෙන් දැනට ලබාගන්නා වී ප්‍රමාණය වැඩි කිරීම සහ ඒ සඳහා ගොවියාට ස්ථිර සාර සහතික මිලක් ලබාදීම හා මේ සඳහා ගොවි සංවිධාන හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දත්ත පවත්වාගෙන යාම හා නිසි අධීක්ෂණය සිදු කිරීම.

## 4.4 සහල් විකිණීම

අදාල දිස්ත්‍රික් සමිති විසින් රජය තීරණය කරන උපරිම සිල්ලර මිල යටතේ ඒ ඒ දිස්ත්‍රික් මට්ටමේ විවිධ සේවා සමූපකාර සමිති හරහා සතොස ප්‍රාදේශීය අලෙවි සැල් හරහා සහල් අලෙවි කල යුතු බව

## 4.5 සමිති අධීක්ෂණය

සියළුම දිස්ත්‍රික් සමිති දිස්ත්‍රික් සමූපකාර සහකාර කොමසාරිස්වරයාගේ පූර්ණ අධීක්ෂණයට නිරතුරුව ලක්විය යුතුය. වී මිලට ගැනීම, සහල් විකිණීම, කාරක ප්‍රාග්ධන මුදල් සාමාජිකයන්ගේ බැංකු ගිණුම් වලට ප්‍රේෂණය කිරීම, සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සංගමය විසින් දිස්ත්‍රික් සමිති වෙත සිදු කරනු ලබන මැදිහත් වීම් අධීක්ෂණය කිරීම මෙන්ම වැඩසටහනේ සෑම අදියරකම ගනුදෙනු හා සිද්ධීන් නිරන්තර අධීක්ෂණය විය යුතු බව.

**4.6 දත්ත පවත්වා ගැනීම**

(අ) වාර්තාවේ දක්වා ඇති වී මිලදී ගැනීම, සහල් නිෂ්පාදනය, සහල් අලෙවිය ආදී මෙම වැඩසටහනට අදාළ දත්තයන් සම්බන්ධයෙන් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියේ ඇති දත්තයන් හා සීමාසහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සංගමය වෙතින් ලබාගත් දත්තයන් අතර වෙනස්කම් පවතින බැවින් ඒ පිළිබඳ සොයාබලා නිවැරදි කිරීම් සිදුකිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(ආ) සමිති මට්ටමේ දෛනික ගනුදෙනු දෛනිකව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කිරීම සහ එම දත්ත විශ්ලේෂණය කර වෙනස්කම් පවතී නම් වහාම ඒ පිළිබඳව සමූපකාර කොමසාරිස්වරුන් මාර්ගයෙන් අදාල ක්‍රියාමාර්ග ගැනීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2021 අප්‍රේල් ෭෩ දින

ඇමුණුම 01

**ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සංගමය විසින් වවුචර්පත් පිළියෙල කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබූ අවස්ථා**

| දිනය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|
| 2019.05.28 | සුළු මුදල් | 5,000.00 |
| 2019.06.04 | වැටුප් | 36,667.00 |
| 2019.06.04 | වැටුප් | 35,742.00 |
| 2019.06.04 | සුළු මුදල් | 25,000.00 |
| 2019.06.26 | සුළු මුදල් | 25,000.00 |
| 2019.07.09 | වැටුප් | 691,218.84 |
| 2019.09.06 | RPCS පොලොන්නරුව | 7,000,000.00 |
| 2019.09.10 | වැටප් | 642,335.63 |
| 2019.09.24 | ඉන්ධන - සභාපති | 25,000.00 |
| 2019.09.30 | ගමන් වියදම්-සභාපති | 25,000.00 |
| 2019.10.10 | - | 347,834.18 |
| 2019.10.14 | RPCS පොලොන්නරුව | 5,800,000.00 |
| 2019.10.14 | මුදල් හුවමාරු | 50,000.00 |
| 2019.10.16 | මුදල් හුවමාරු | 200,000.00 |
| 2019.10.18 | වැටුප් | 158,223.35 |
| 2019.10.18 | නවාතැන් වියදම්-සභාපති | 90,000.00 |
| 2019.10.31 | RPCS පොලොන්නරුව | 15,000,000.00 |
| 2019.10.31 | - | 80,000.00 |
| 2019.11.04 | සභාපති -දීමනා | 22,500.00 |
| 2019.11.14 | දිස්ත්‍රික් ලේකම් | 20,000,000.00 |
| 2019.11.13 | වැටුප් | 720,266.80 |
| 2019.11.20 | - | 2,250.00 |
| 2019.11.21 | - | 2,250.00 |
| 2019.11.27 | සුළු මුදල් | 25,000.00 |
| 2019.11.27 | ඉන්ධන | 17,000.00 |
| | | ----------------- 51,026,287.80 |

ඇමුණුම 02

ලැබීම් කුවිතාන්සි විගණනයට ඉදිරිපත් නොවූ අවස්ථා

| දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| 2019/06/21 | RPCS අනුරාධපුර | 400,000 |
| 2019/07/05 | RPCS අනුරාධපුර | 445,015 |
| 2019/08/23 | - | 20,000 |
| 2019/10/16 | අවිනිශ්චිත ගිණුම | 105,825 |
| 2019/10/30 | අවිනිශ්චිත ගිණුම | 1,192,500 |
| 2019/11/04 | Sales Outlet | 45,430 |
| 2019/11/06 | Sales Outlet | 19,700 |
| 2019/11/06 | Sales Outlet | 1,100 |
| 2019/11/07 | Sales Outlet | 23,075 |
| 2019/11/09 | Sales Outlet | 13,900 |
| 2019/11/09 | Sales Outlet | 1,200 |
| 2019/11/14 | Sales Outlet | 27,050 |
| 2019/11/22 | Sales Outlet | 24,500 |
| 2019/11/22 | RPCS පුත්තලම | 10,250 |
| 2019/11/25 | Sales Outlet | 8,660 |
| 2019/11/26 | Sales Outlet | 11,000 |
| 2019/11/27 | Sales Outlet | 21,060 |
| | | ------------<br>2,370,265 |